\- දල කෙටුම්පතකි -

# බැබව එල්ලංගා පැතිකඩ සහ මූලික සංවර්ධන සැලැස්ම


**සැකසීම**

*බැබව එල්ලංගා පද්ධති කලමණාකරන කමිටුව*
තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
හම්බන්තොට දිස්ත්‍රික්කය



**අනුග්‍රහය**

ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම ආමාත්‍යාංශය විසින්
ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය
නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය
දකුණු පළාත

# පටුන

01. හැඳින්වීම ........ 3

1.1 එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය ........ 3

1.2 එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම ........ 4

1.3 එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය ........ 5

1.4 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම ........ 6

1.5 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු ........ 6

1.6 ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම: ........ 7

1.7 බැබව එල්ලංගාව ........ 8

1.7.1 බැබව එල්ලංගා පද්ධතියේ සිතියම ........ 9

1.7.2 බැබවඑල්ලංගාවේ වැව් පිලිබඳ තොරතුරු ........ 11

1.8 බැබව එල්ලංගාව තිරසර ලෙස කළමණාකරනය කිරීමේ වැදගත්කම ........ 12

1.9 බැබව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය ........ 12

02. බැබව එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය ........ 14

2.1 බැබව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම ........ 14

03. බැබව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ ........ **Error! Bookmark not defined.**

3.1 භූගෝලීය (Geographical ) තොරතුරු ........ 15

3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු ........ 16

3.3 ජල විද්‍යාත්මක (Hydrological) තොරතුරු ........ 17

3.4 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු ........ 19

3.5 එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය (Human Livelihood) ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු ... 21

3.6 සමාජ ආර්ථික (Socio - Economic) තොරතුරු ........ 22

3.7 එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් (Constructions) කටයුතු පිලිබඳ තොරතුරු ........ 23

3.8 එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා (Cropping Patterns) පිලිබඳ තොරතුරු ........ 24

3.9 එල්ලංගාවේ වාරිමාර්ග කලමණාකරනය (Irrigation Management) පිලිබඳ තොරතුරු ........ 26

3.10 පෝෂක ප්‍රදේශයේ (Command Area) වර්තමාන තත්වය පිලිබඳ තොරතුරු ........ 26

04. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග ........ 28

4.1 එල්ලංගාවේ උග්‍ර ගැටළු (Critical Issues) ........ 28

4.2 එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ පරමාර්ථ සහ අරමුණු ........ 30

4.3 එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් ........ 30

05. එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ........ 34

5.1 යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්,වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දල මූල්‍ය දායකත්වය....................44
5.2 දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම් ....................48
5.3 එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය ....................51

06. ඇමුණුම් ....................53

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය ....................53
ඇමුණුම් 02 - හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය ....................59
ඇමුණුම් 03 - එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම සහ එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා සහභාගී වූ ආයතන වල ලේඛණය ....................59
ඇමුණුම් 04 - උප ව්‍යාපෘති යෝජනා ආකෘතිය ....................60

<u>**වගු ලේඛණය**</u>

වගු අංක 1 බැබව එල්ලංගාව පිලිබඳ පරිපාලන තොරතුරු ....................8
වගු අංක 2 - එල්ලංගාවේ වැව් පිලිබඳ විස්තර ....................11
වගු අංක 3 - එල්ලංගාවේ ජල පෝෂකයන් පිලිබඳ තොරතුරු ....................17
වගු අංක 4 - බැබව එල්ලංගා පද්ධතියේ මූලිකාංග ....................17
වගු අංක 5 - පසුගිය කන්න 5 තුල එල්ලංගාව තුල පිහිටි වැව් වල බෝග වගා රටාව....................24
වගු අංක 6 - එක් එක් වැව යටතේ සැලසුම් කරන ලද වගා ඉඩම් ප්‍රමාණය සහ දැනට වගා කරන ඉඩම් ප්‍රමාණය ....................26
වගු අංක 7 - ජලය බෙදා හැරීමේ ඇලවල් හා වගාබිම් ප්‍රමාණයන් ....................27
වගු අංක 8 - එල්ලංගාවේ උග්‍ර ගැටළු....................29
වගු අංක 9 - අරමුණු සාධනය සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්....................31
වගු අංක 10 - එල්ලංගා පද්ධති කළමණාකරනය සඳහා ක්‍රියාතකාරකම්,කාලරාමුව සහ වගකීම් සැලැස්ම (Gannt සටහන ) ....................35
වගු අංක 11 - ඇස්තමේන්තුගත වියදම....................44
වගු අංක 12 - උපායමාර්ගික මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවා ක්‍රියාත්මක කාල රාමුව....................48

සිතියම් අංක 1- බැබව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා වල සිතියම ....................7
සිතියම් අංක 2 - බැබව එල්ලංගා පද්ධතියේ සිතියම....................10

රූපසටහන් අංක 1 - එල්ලංගා පද්ධති කළමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන ......5
රූප සටහන් අංක 2 - එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව ....................16
රූප සටහන් අංක 3 - මාසික සාමාන්‍ය වර්ෂාපතනය (1984 – 2020) ....................18
රූප සටහන් අංක 4 - කළමණාකරන තොරතුරු ගලා යන ආකාරය ....................52

# බැබව එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම

## 01. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයක් වන අතර එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසාර පැවැත්ම තහවුරු කරයි. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) **එල්ලංගා පද්ධතිය** ලෙස හැඳින්වේ.

වාරි ශිෂ්ඨාචාරයේ ඉතාමත් විශිෂ්ඨ නිර්මාණයක් වන එල්ලංගාව ආරක්ෂා කර සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සහ එල්ලංගා කළමණාකරනය පහසු කිරීම සඳහා එල්ලංගාවේ ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) ව්‍යාපෘති බල ප්‍රදේශයේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලබයි.

### 1.1. එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට ආහාර පිසීම වැනි ගෘහ කටයුතු සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රූප සටහන් අංක 1 අනුව රාජ්‍ය, පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරනු ලබයි. එසේ වූවද අංක 3 කොටසේ සඳහන් පරිදි නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක් විමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වඩාත් අවශ්‍ය වී ඇත.

## 1.2. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වාරි කළමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එනම්, ″**එල්ලන්**″ සහ ″**ගාව**″ යන වචන දෙක එකතු වී සකස් වී ඇත. ″**එල්ලන්**″ යනු එල්ලෙන යන්නයි. ″**ගාව**″ යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙසද නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා එල්ලංගාවට කළමණාකරන සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. එසේම එල්ලංගා කළමණාකරන කමිටු නීතිගත කිරීමටද අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. පරිපාලන දිස්ත්‍රික්ක 11 ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 54ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 54 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවි සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, ජල සම්පත් මණ්ඩලය, ආපදා කළමණාකරන කාර්යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව යන ආයතන වේ. එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මුල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන් අංක 1 මගින් දක්වා ඇත.

*රූපසටහන් අංක 1: එල්ලංගා පද්ධති කළමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන*

## 1.3 එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා අතීතයේ පැවති සාම්ප්‍රදායික ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු

හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලබයි. මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 1.4 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවි ප්‍රජාවට එල්ලංගාව පිලිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කරනු ලබයි.

## 1.5 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ ඒවායේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කරනු ලබයි.

1.5.1. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම .

1.5.2. එල්ලංගාව පද්දතියේ වඩාත් උග්‍ර ගැට විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම.

1.5.3. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබදව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

## 1.6 ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම:

බැබව එල්ලංගාවට යාබදව කිරිදි ඔය ගංගා දෝණියේ සහ මැණික් ගඟ දොණියේ එල්ලංගා පද්ධති 3ක් පිහිටා ඇත. ඒවා නම්, නිමලව එල්ලංගාව, යෝධ වැව එල්ලංගාව සහ කොච්චිපතාන එල්ලංගාවයි. මෙම එල්ලංගා සියල්ල යෝධකණ්ඩිය ගොවිජන සේවා බල ප්‍රදේශය තුල පිහිටා ඇත. ඉන් නිමලව එල්ලංගාව වර්ග කි.මී.30.5 ක් පමණ විශාල වන අතර එහි වැව් 4 ක් පිහිටා ඇත. එහි කොටසක ජනතාව පදිංචි වී කෘෂිකාර්මික කටයුතු සිදු කරනු ලබයි. ඉතිරි කොටස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කැලෑ ප්‍රදේශය වේ. කොච්චිපතාන එල්ලංගාව වර්ග කි.මී.19.7 ක් පමණ විශාලත්වයකින් යුක්ත වන අතර එහි වැව් 4 ක් පිහිටා ඇත. මෙහි කෘෂිකාර්මික ඉඩම් හා වන සංරක්ෂණ හා වනජීවී දෙපාර්තමේන්තු වලට අයත් ඉඩම්, ඇති අතර එල්ලංගාව තුල මානව ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් සිදුවෙමින් පවතියි. යෝධවැව එල්ලංගාව වර්ග කි.මී. 58.76 ක් පමණ විශාලත්වයකින් යුත් එල්ලංගාවක් වන අතර මෙම පද්ධතිය තුල වැව් 9 ක් ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් වලින් සහ පෞද්ගලික අයිතිය යටතේ ඇති ඉඩම් වලින් එල්ලංගා සමන්විත වේ. මහසෙන්පුර, ජුල්පල්ලම, කාවන්තිස්සපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල කොටස් මෙම එල්ලංගාවට අයත් වේ. බැබව එල්ලංගාව සහ ඊට යාබදව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා වල සිතියමක් සිතියම් අංක 01 යටතේ පහත දක්වා ඇත.

සිතියම් අංක 01 - බැබව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා වල සිතියම



**මූලාශ්‍රය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

## 1.7 බැබව එල්ලංගාව

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යෝධකණ්ඩිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ උද්දකන්දර, රණකෙලිය සහ කාවන්තිස්සපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුල බැබව එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. මෙම එල්ලංගා පද්ධතියේ වැව් 17 ක් පමණ තිබෙන අතර ඉන් වැව් 3 ක් කුළු වැව් වේ. අනෙකුත් සියලුම වැව් ඔලගම් වැව් වේ. මීට අමතරව එක් එක් පුද්ගලයින් විසින් ඉදිකර ගන්නා ලද කුඩා පරිමාණයේ පෞද්ගලික වැව් (Individual tank) 12 ක් පමණ එල්ලංගාව තුල පිහිටා ඇත. මෙම එල්ලංගා පද්ධතිය වර්ග කි.මී. 64 (හෙක්. 6400) ක පමණ භූමි භාගයක ව්‍යාප්ත වී ඇති අතර මුළු එල්ලංගා පද්ධතියම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් බල ප්‍රදේශය තුල පිහිටා ඇත. බල ප්‍රදේශයේ පාරම්පරික කුඹුරු වගා කරනු ලබන ගොවීන්ට වගා කිරීමට අවසර ඇති අතර පදිංචි වීමට ඉඩදෙනු නොලැබේ. භූමියේ පිහිටීම අනුව එල්ලංගාවේ පහල මායිම මුහුදු මට්ටමේ සිට මීටර් 10.9 ක් පමණ උස වන අතර එල්ලංගා පද්ධතියේ ඉහල මායිමේ උස මීටර් 59 ක් පමණ වේ. හුදකලා කඳු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතියම මීටර් 100 කට වඩා අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. උසම කන්ද අලුත් වැව කන්ද වන අතර එය මීටර් 112 ක් පමණ උස වේ. එල්ලංගාව තුල පිහිටි භූමියෙන් වර්ග කි.මී. 14.2 (හෙක්. 1420) ක් පමණ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඇති ආරක්ෂිත කැලය වන අතර ඉතිරි ප්‍රමාණය වන වර්ග කි.මි. 49.8 (හෙක්. 4980) ක් පමණ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඇති ඉඩම් වේ. මෙම ඉඩම් වලින් වර්ග කි.මී. 31.46 (හෙක්. 3146) ක් පමණ ක් පමණ කැලෑ සහ ලඳු කැලෑ වශයෙන් පවතින අතර ඉතිරි වර්ග කි.මී. 18.44 (හෙක්. 1844) ක් පමණ කුඹුරු වගාව, හේන් වගාව හා බහු වාර්ෂික බෝග වගාව සඳහා භාවිතා කරයි. ඉන් වැඩිම ඉඩම් ප්‍රමාණයක් එනම් හෙක්. 1549 ක් පමණ හේන් වගාව සඳහා භාවිතා කරයි.

වගු අංක 1 බැබව එල්ලංගාව පිලිබඳ පරිපාලන තොරතුරු

| මූලික තොරතුරු | විස්තර | විශේෂිත කරුණු |
|---|---|---|
| දිස්ත්‍රික්කය | හම්බන්තොට | – |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | තිස්සමහාරාමය | – |
| මැතිවරණ බල ප්‍රදේශය | තිස්සමහාරාමය | – |
| ගංගා දෝණිය | බම්බාව ආරු (අංක 23) | – |
| එල්ලංගාව | බැබව | – |

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරී කොට්ඨාශ | උද්දකන්ධර/ රණකෙලිය/ කාවන්තිස්සපුර | රණකෙලිය ග්‍රාම නිලධාරී කොට්ඨාශය සඳහා බැබව වැවේ පෝෂක ප්‍රදේශය පමණක් ඇතුලත් වේ. කාවන්තිස්සපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල අලුත් වැව සහ අමර වැව පිහිටා ඇත. අනෙකුත් සියලුම වැව් උද්දකන්දර ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල පිහිටා ඇත. |
| එල්ලංගාවේ භූමි ප්‍රමාණය | හෙක්. 6400 | ගංගා දෝණියේ වර්ග ප්‍රමාණය වර්ග කි.මී. 84 කි. |
| කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව | 14 | මීට අමතරව පුද්ගලයින් විසින් සංවර්ධනය කර ඇති පෞද්ගලික වැව් 12 ක් ප්‍රදේශයේ පවතී. |
| පැහැදිලිව හඳුනා ගත හැකි ජල පෝෂක ප්‍රදේශ | 17 | – |
| තහනම් කැළෑ ප්‍රදේශ ගණන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු රක්ෂිත කැලය | හෙක්. 1640 |
| පෝෂක ප්‍රදේශයේ පදිංචි පවුල් සංඛ්‍යාව | 15 | අනවසරයෙන් පදිංචිව ඇත. |
| වනාන්තරයේ පිහිටි වැව් සංඛ්‍යාව | 03 | මෙම වැව් කුළු වැව් වන අතර වැව් දෙකක් වනජීවී සංරක්ෂන දෙපාර්තමේන්තුව මගින් වන සතුන් සඳහා භාවිතා කරයි. අමර වැව යටතේ මුලදී වගා කටයුතු කර පසුව සත්ව පාලන කටයුතු සඳහා භාවිතා කරයි. |
| එල්ලංගාව තුලින් ජීවනෝපාය සැලසෙන පවුල් සංඛ්‍යාව | 2100 | ස්ථිර පදිංචි පවුල් සංඛ්‍යාව 15 ක් වන අතර කෘෂිකාර්මික කටයුතු වල නිරත අනෙකුත් අය ප්‍රදේශයෙන් පිටත පදිංචි වී ඇත. |

මූලාශ්‍රය - ගොවි සංවිධාන / යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය

## 1.7.1 බැබව එල්ලංගා පද්ධතියේ සිතියම

දැනට පවතින බැබව එල්ලංගා සිතියම යාවත්කාලීන වී නැත. එම නිසා වඩාත් නිවැරදි එල්ලංගා සිතියමක් එල්ලංගා පැතිකඩට ඇතුලත් කිරීමේ අපේක්ෂාවෙන් හරස්කඩ චාරිකාවේදී එකතු කර ගන්නා ලද දත්ත පදනම් කරගෙන නව සිතියමක් සංවර්ධනය කරන ලදී.

ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද නව බැබව එල්ලංගා සිතියම, සිතියම් අංක 02 යටතේ පහත දැක්වේ.

සිතියම් අංක 2 : බැබව එල්ලංගා පද්ධතියේ සිතියම




මූලාශ්‍රය - ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## 1.7.2 බැබව එල්ලංගාවේ වැව් පිලිබඳ තොරතුරු

මෙම එල්ලංගාවේ කුඩා වාරිමාර්ග 17 ක් ඇත. මීට අමතරව පුද්ගලයින් විසින් සාදාගෙන ඇති පෞද්ගලික වැව් 12 පමණ තිබේ. මෙම සියලුම වැව් වනජීවි කලාපය තුළ හා වන සංරක්ෂණ කලාපය තුළ පිහිටා ඇත. එල්ලංගාවේ පිහිටි වැව් පිළිබද තොරතුරු පහත වගු අංක 02 හි දැක්වේ.

වගු අංක 2 - එල්ලංගාවේ වැව් පිලිබඳ විස්තර

| අනු අංක | වැවේ නම | ග්‍රාම නිළධාරි වසම | පිහිටීම දැක්වෙන වැවේ ඛණ්ඩාංක | | ජල ධාරිතාවය අක්කර/අඩි | පෝෂක ප්‍රදේශය (හෙක්.) | ගොවි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | උතුරු (මීටර්) | නැගෙනහිර (මීටර්) | | | |
| 1 | තඹරව | උද්දකන්ධර | 423649.745 | 564652.169 | 483.67 | 62 | 70 |
| 2 | බැන්දූ වැව | උද්දකන්ධර | 425083.103 | 567175.577 | 502.06 | 57 | 64 |
| 3 | හැලබවැව | උද්දකන්ධර | 423776.230 | 565973.645 | 21.61 | 12 | 15 |
| 4 | කරබිංඩංග | උද්දකන්ධර | 422774.151 | 563254.191 | 26.69 | 5 | 8 |
| 5 | මයිල ගස් වැව | උද්දකන්ධර | | | - | 6 | 5 |
| 6 | කරුවලවංගුව | උද්දකන්ධර | 422625.063 | 564549.467 | 29.94 | 11 | 32 |
| 7 | රොටවල වැව | උද්දකන්ධර | 422800.987 | 565582.927 | 149.21 | 26 | 46 |
| 8 | පූල්පතාන වැව | උද්දකන්ධර | 422130.598 | 564275.614 | 247.59 | 21 | 22 |
| 9 | අලිවල වැව | උද්දකන්ධර | | | - | 5 | 14 |
| 10 | මුවන් වැව | උද්දකන්ධර | 421482.684 | 565449.380 | 22.46 | 12 | 30 |
| 11 | මයිලත්ත | උද්දකන්ධර | 421453.724 | 566241.470 | 72.08 | 14 | 20 |
| 12 | මලිත්තන් වැව | උද්දකන්දර | | | - | 2 | 1 |
| 13 | බැබව | රණකෙලිය | | | 335.45 | 24 | 25 |
| 14 | අලුත් වැව | කාවන්තිස්සපුර | | | - | 6 | 8 |
| 15 | අමර වැව | කාවන්තිස්සපුර | | | වගා කටයුතු සිදු නොකරයි. | - | - |
| 16 | දෙයියන්ගේ වැව | | | | වගා කටයුතු සිදු නොකරයි | - | - |
| 17 | පනාගම්මන වැව | | | | වගා කටයුතු සිදු නොකරයි | - | - |
| | එකතුව | | | | 1890.76 | 263 | 360 |

මූලාශ්‍රය - ගොවි සංවිධාන / යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය

## 1.8 බැබව එල්ලංගාව තිරසර ලෙස කළමණාකරනය කිරීමේ වැදගත්කම

CSIAP මගින් ප්‍රතිසංස්කරණය කරන ලද අලිවල වැව

බැබව එල්ලංගාවේ වැව් 17 න් 14 ක දළ වශයෙන් හෙක් 263 පමණ මහ කන්නයේ වී හා ගොඩ බෝග වගා කරනු ලබයි. එම ගොවීන් සංඛ්‍යාව 360 ක් පමණ වේ. මීට අමතරව එල්ලංගාව තුල පිහිටි පෞද්ගලික වැව් 12 හි හෙක්ටයාර 18 ක් පමණ ගොවීන් 15 ක් විසින් වගා කරනු ලබයි. මෙම 375 ක් පමන වන කුඹුරු වගා ගොවීන් සහ 1725 පමණ වන හේන් වගා ගොවීන් එල්ලංගාවෙන් ජීවනෝපාය සලසා ගන්නා අතර ඔවුන් කුඩා වැව් වලින් ලැබෙන ජලය හා වාර්ෂාවෙන් ලැබෙන ජලය ප්‍රයෝජනයට ගෙන වගා කටයුතු සිදු කරනු ලබයි. කෙසේ වුවද මෑතකදී එල්ලංගා පැතිකඩ සංවර්ධනය සඳහා සිදු කරනු ලැබූ සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකාවෙන් හා අදාල ලේඛණ පරිශීලනය මගින් එකතු කරන ලද, ජනනය කරන ලද දත්ත හා තොරතුරු තුලින් එල්ලංගාවේ විවිධ අංශ විවිධ හේතු නිසා හානියට පත් වී ඇති බව අනාවරනය විය. කෙසේ වුවද එල්ලංගාවේ පිහි ටි වැව් 17 න් 11 ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී

හරස්කඩ චාරිකාව යන අතර

කරගනිමින් ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර බැබව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතිය සහාය ලබාදේ.

## 1.9 බැබව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය

බැබව එල්ලංගා පැතිකඩ සකස් කිරීම සඳහා මූලාංශ්‍ර කිහිපයක් ඔස්සේ තොරතුරු ලබා ගන්නා ලදී. හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත, කණ්ඩායම් සාකච්ඡා ඒ අතර ප්‍රධාන වූ අතර ද්විතීය දත්ත ලෙස ව්‍යාපෘතියේ සංවේදී කලාප සඳහා සකස් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යාත්මක තක්සේරුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වලින් ලබා ගත් තොරතුරු භාවිතා කරන ලදී. මීට අමතරව ප්‍රාථමික දත්ත

ජනනය කිරීම සඳහා හරස්කඩ චාරිකාවක්ද (Transect Walk) සියලු පාර්ශවකාර සංවිධානවල සහභාගීත්වයෙන් සිදුකරන ලදී. එල්ලංගාවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ 4 ම එනම්, ගල් ආර, කරුවල වංගුව ආර, බැන්දු වැව ආර, කොටිගල ආර ආවරණය වන පරිදි එල්ලංගාවේ අවසන් වැව වන බැබව වැව දක්වා කණ්ඩායම් 3 ක් මගින් 2023.05.16 දින පැවැති හරස්කඩ චාරිකාවේදී තොරතුරු ලබා ගන්නා ලදී. මෙම හරස්කඩ චාරිකාවේදී එක් කණ්ඩායමක් ජුල්පතාන වැවේ සිට අලිවල වැව, මුවන් වැව, මයිලත්ත වැව හරහා බැබව වැව දක්වාද, තවත් කණ්ඩායමක් පනාගම්මන වැවේ සිට බැන්දු වැව හා හැලඹ වැව හරහා බැබව වැව දක්වාද, අනෙක් කණ්ඩායම තඹරව වැවේ ඉහල එල්ලංගා මායිමේ සිට තඹරව, කරපිඩංග, කරුවලවංගුව, රොටවල වැව හරහා බැබව වැව දක්වාද, ගමන් කරන ලදී. මෙම හරස්කඩ චාරිකාවේදී ගමන් මාර්ගයේ මීටර් 100 න් 100 ට තොරතුරු ලබා ගන්නා ලද අතර ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු, සම්පත් හායනය හා සම්පත් හායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගී වූ අතර චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කරගන්නා ලදී.

විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල් වනු ඇත.

# 02. බැබව එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, බැබව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කළමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා එල්ලංගා කළමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

**එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. ( I ) රැස්වීම් පැවැත්වීම,** (ii) ද්විතීය දත්ත එකතු කිරීම, (iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම, (iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම, (v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම, (vi) එල්ලංගා පැතිකඩ සැකසීම, (vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, (viii) යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම, (ix) එල්ලංගා සැලැස්ම සැකසීම, (x) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම, (xi) එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කිරීම, (xii) යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු තීරණය කිරීම හා දල ඇස්තමේන්තුවක් සකස් කිරීම ආදිය එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්මට ඇතුලත් කරන ලදී.

## 2.1. බැබව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

බැබව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6 ක දිස්ත්‍රික්ක 11 ක එල්ලංගා පද්ධති **57** ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 54 ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ

කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ වාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගාව හරහා වාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි 4 වන කොටස යටතේ දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. **ඒවා නම් 1. භූගෝල විද්‍යාත්මක, 2. භූ විද්‍යාත්මක, 3. ජල විද්‍යාත්මක, 4. පාරිසරික විද්‍යාත්මක, 5. මානව හැසිරීම්, 6. සමාජ ආර්ථික, 7. කෘෂිකාර්මික, 8. වාරිමාර්ග කලමණාකරන,** 9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි. මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

# 3. බැබව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

## 3.1. භූගෝලීය (Geographical ) තොරතුරු

බැබව එල්ලංගා පද්ධතිය තුල අමර වැව කන්ද1, අමර වැව කන්ද 2, අලුත් වැව කන්ද 1, අලුත් වැව කන්ද 2, කොටිගල කන්ද, වශයෙන් කඳු 5ක් ඇති අතර මේවායේ උස පිලිවෙලින් මීටර් 109, 94.5, 112.4, 94.8 හා 56 ක් පමණ වේ. මෙම කඳු වැටි වලින් 4 ක්ම අමර වැව සහ අලුත් වැව ආශ්‍රිතව පිහිටා ඇති අතර කොටිගල කන්ද අලිවල වැව හා ජුල්පතාන වැව අතර පිහිටා ඇති සැතපුම් 1.57 ක් පමණ දිගැති කඳු වැටියකි. කඳු හැරුනු විට අනෙක් ප්‍රදේශ, ජල මාර්ග වලට අනුක්‍රමිකව බෑවුම් වන තැනිතලා ප්‍රදේශයක් වන අතර මූලික වශයෙන් බැබව වැව ආශ්‍රිතව හෙක්. 65 පමණ වැලි සහිත තැනිතලා භූමියක් පවතී. බැබව වැව කුඹුරු යාය අවසානයේ බැබව කලපුව පිහිටා ඇති අතර එය වර්ග කි.මී. 2.6 ක් පමණ වේ.

එල්ලංගාවේ උන්නතාංශය ගත් කල කලපුව ආශ්‍රිතව මීටර් 3.3ක් පමණ උසක් ඇති අතර බැබව ආශ්‍රිතව මීටර් 10.9 ක් පමණ උසක් පවතී. බැන්දූ වැව ආර ජල පෝෂක ප්‍රදේශයේ එල්ලංගා මායිමේ මුහුදු මට්ටමේ සිට උස මීටර් 45.5 ක් පමණ වන අතර එය බැන්දූ වැවට එන විට මීටර් 23.2 ක් දක්වා අඩු වේ. එසේම එය හැළඹ වැව වන විට මීටර් 17.9 ක් දක්වා ක්‍රමානුකූලව අඩු වේ. එසේම ගල් ආර ජල පෝෂකයේ එල්ලංගා පද්ධති මායිමේ මුහුදු මට්ටමේ සිට උස මීටර් 59 ක් වන අතර එය කි.මී. 7 ක් පමණ පහලින් පිහිටා ඇති තඹරව වැව දක්වා එන විට මීටර් 22.8 දක්වා අඩුවේ. කරපිඩංග ආර ජල පෝෂකයේ එල්ලංගා මායිමේ උස මුහුදු මට්ටමේ සිට මීටර් 36 ක් වන අතර එය කි.මී. 22.8 ක් පමණ පහලින් පිහිටා ඇති රොටවල වැව දක්වා එන විට මීටර් 17.1 ක් දක්වා අඩු වේ. තවද එල්ලංගාවේ තවත් උප ජල පෝෂකයක් වන කොටිගල ආර ප්‍රදේශයේදී එල්ලංගා මායිමේ උස මුහුදු මට්ටමේ සිට මීටර් 54.8 ක් වන අතර එය කි.මී. 2ක් පමණ පහල පිහිටා ඇති මලිත්තන් වැව ප්‍රදේශය වන විට එහි මීටර් 15.5 ක් දක්වා අඩු වේ.

## 3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගා පද්ධතියම DL 5 කෘෂි පාරිසරික කලාපයට ඇතුලත් වන අතර මූලික වශයෙන් ප්‍රදේශයේ බහුල වශයෙන් බොරළු මිශ්‍ර රතු දුඹුරු පස ඇත. එහෙත් කුඹුරු වල ලොම් පස පවතී. බැබව වැව ආශ්‍රිතව සහ බැබව වෙල් යායේ බහුල වශයෙන් ලවණ මිශ්‍ර වැලි පස හා මැටි පස පවතී. එල්ලංගා පද්ධතියේ භූමි පරිභෝග රටාව ගත් විට වනාන්තර ලෙස හෙක්ටයාර් 2538 ක්ද, ලදු කැලැව ලෙස හෙක්ටයාර් 2020 ක් පමණ ද, හේන් වගා බිම් ලෙස හෙක්ටයාර් 1549 ක් පමණ ද, කුඹුරු ඉඩම් ලෙස හෙක්ටයාර් 278 ක් පමණ ද, බහු වාර්ෂික බෝග වගාව සඳහා හෙක්ටයාර් 15 ක් පමණද, යොදා ගෙන ඇත. මෙලෙස වැඩි වනගහනයක් ඇත්තේ මුළු පද්ධතියම ආරක්ෂිත කැලෑ යටතට ගැනෙන බැවිනි. මෙම එල්ලාංගාවේ භූමි ප්‍රමාණයෙන් 28% පමණ කෘෂි කාර්මික කටයුතු සඳහා යොදාගෙන ඇත.

රූප සටහන් අංක 02 - එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව




මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘති මගින් සිදු කරනු ලැබූ ජල විද්‍යාත්මක තක්සේරුව - 2021

මෙම එල්ලංගාවේ කඳවුරු භූමි (Camp sites) 20 ක් ඇති අතර සමහර ඒවායේ ස්ථිර ගොඩනැගිලිද ඉදි කර ඇත. එසේම සමහර ඒවායේ ඉඩම් වල ස්ථිර බෝගද වගා කර ඇත. එසේම වියළි කලාපීය වනාන්තර වල දක්නට ලැබෙන පලු,වීර, කටුපිල, එරමිණියා, දං, දිවුල් බහුලව ඇති අතර බැබව ආශ්‍රිත ලවණතාවය ඇති ප්‍රදේශයේ ලවණතාවයට ඔරොත්තු දෙන මලිත්තන් ශාක බහුල වශයෙන් දක්නට ලැබේ.

ඛණිජ ද්‍රව්‍ය වශයෙන් මැණික්, බොරළු හා වැලි ඇති අතර නීත්‍යානුකූල නොවන ලෙස මැණික් ගැරීම අමර වැව ආශ්‍රිතව සිදු වේ. එල්ලංගාව තුල

අනවසරයෙන් වැලි ගොඩ දැමීම සිදුවන අතර එය අලිවල ප්‍රදේශයේ බහුල වශයෙන් සිදු වේ. භූ දර්ශන රටාව ගත් විට එල්ලංගාවේ ඉහල සිට පහල දක්වා ක්‍රමානුකූලව බෑවුමක් දක්නට ලැබේ.

## 3.3 ජල විද්‍යාත්මක (Hydrological) තොරතුරු

එල්ලංගාව හරහා බම්බාව ඔය ගමන් කරනු ලබන අතර එය කුඩා ජල ධාරාවන් 4 ක් මගින් පෝෂණය වේ. ඒවායේ වැසි කාලයට පමණක් ජලය ගලා බසින අතර වියලි කාලයේදි ජලය සිඳී යයි. මෙම එක් එක් ජල පහරවල් සහ ඒවායේ ජල පෝෂක ප්‍රදේශ පහත වගු අංක 03 හි දක්වා ඇත.

වගු අංක 3 : එල්ලංගාවේ ජල පෝෂකයන් පිලිබඳ තොරතුරු

| ජල පෝෂකය | පෝෂක ප්‍රදේශය (වර්ග කි.මී) |
|---|---|
| බැන්දූ වැව ආර | 23.8 |
| ගල් ආර | 17.2 |
| කරපිඩංග ආර | 6.4 |
| කොටිගල් ආර | 4.7 |

මූලාශ්‍රය - ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද බැබව එල්ලංගාවේ භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සිතියම.

සාමාන්‍යයෙන් සම්ප්‍රදායික එල්ලංගාවක නිශ්චිත, සම්මත මූලිකාංග රාශියක් ඇත. ඒ අතර බැබව එල්ලංගාවේ ප්‍රධාන මූලිකාංග වගු අංක 4 හි දැක්වේ.

වගු අංක 4 : බැබව එල්ලංගා පද්ධතියේ මූලිකාංග

| ජල විද්‍යාත්මක ලක්ෂණ | වර්තමාන තත්වය |
|---|---|
| මහ වැව හෝ පහල වැව | පහල වැව ඇතිමුත් එය සාම්ප්‍රදායික පහල වැව නොවේ. ජනතාව පදිංචි නැත. |
| කුළු වැව් | වැව් 3ක් ඇති අතර එහි එක් වැවක වැව් කණ්ඩිය කැඩී ඇත. |
| කයාන් වැව | නොමැත |
| ඔලගම් වැව | කුළු වැව් 3 හැරුණු විට අනෙකුත් වැව් 14 ම ඔලගම් වැව් වේ. මින් වැව් 11 ක් ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කිරීමට නියමිත අතර එක් වැවක පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි වැව් වල පුනරුත්ථාපන කටයුතු මේ දිනවල සිදු කරමින් පවතී. |
| ඉහල වැව | නොමැත |
| ගොඩ වල | නොමැත |
| ඉස්වැටිය | නොමැත |

මූලාශ්‍රය - එල්ලංගා කළමණාකරන කමිටුව විසින් පවත්වන ලද හරස්කඩ චාරිකාවේදී මෙම තොරතුරු එකතු කර ඇත.

එසේම සාම්ප්‍රදායික එල්ලංගාවේ පිහිටි ගස්ගොම්මන හා කට්ටකඩුව මෙම වැව් වල නොමැත. එම නිසා පාංශු ඛාදනය හේතුවෙන් වැව් වල රොන්මඩ තැන්පත් වීම, වැව් කණ්ඩි ඛාදනයට ලක් වීම හා කුඹුරු වල ලවණතාවය ඇති වීම වර්ධනය වෙමින් පවතී. එසේම එල්ලංගා තුල ජලය පරිහරණය කරන්නන් අතර ජල හුවමාරුවක් සිදු නොවන අතර කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමුඛතාවය හිමි වී ඇත. මෙම තත්වය එල්ලංගාවේ තිරසර පැවැත්මට තර්ජනයකි. තවද වැව් අතරද ජල හුවමාරුවක් සිදු නොවේ.

පසුගිය වසර 36 තුල එනම්, 1984 සිට 2020 දක්වා එල්ලංගා බලප්‍රදේශයට ලැබී ඇති දෛනික වර්ෂාපතනය පදනම් කරගෙන සකස් කරන ලද මාසික සාමාන්‍ය වර්ෂාපතනය පහත රූප සටහන් අංක 3 හි දැක්වේ.

රූප සටහන් අංක 3 : මාසික සාමාන්‍ය වර්ෂාපතනය (1984 – 2020)




මූලාශ්‍රය - කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

තවද එල්ලංගා බල ප්‍රදේශයේ සම්මත මාසික පැන් වාෂ්පීකරණය (Pan evaporation) පිළිබඳ තොරතුරු පහත වගු අංක 5 හි දැක්වේ.

වගු අංක 5 : පැන් වාෂ්පීකරණය

| මාසය | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පැන් වාෂ්පීකරණය | 99 | 106 | 116 | 105 | 100 | 121 | 158 | 158 | 146 | 120 | 77 | 88 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ජල විද්‍යාත්මක අත් පොත (2018/19)

ඉහත වගුව අනුව වැඩිම පැන් වාෂ්පීකරණයක් ජුනි සිට සැප්තැම්බර් දක්වා පවතින බව සනාථ වේ.

එසේම එල්ලංගාවේ පිහිටි වැව් වලින් තෝරාගත් වැව් 10 කට වර්ෂාපතනයෙන්, ඉහල වැව් වල අපවහන ජලය මගින් හා ඉහල වැව් පිටාර ගැලීම මගින් මාසිකව ලැබෙන ජල ප්‍රමාණයන් පහත වගු අංක 6 හි දැක්වේ.

වගු අංක 6 - එල්ලංගාවේ පිහිටි වැව් වලට මාසිකව ලැබෙන ජල ප්‍රමාණය

| වැව | මාසිකව ලැබෙන ජල ප්‍රමාණය (අක්කර අඩි) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| බැන්දු වැව | 190.03 | 34.77 | 27.08 | 51.59 | 8.21 | 0.05 | 0.32 | 14.91 | 34.31 | 213.25 | 370.50 | 394.98 |
| හැළඹ වැව | 180.53 | 39.55 | 24.77 | 44.17 | 12.91 | 6.68 | 6.15 | 14.16 | 29.25 | 172.49 | 307.06 | 560.99 |
| තඹරව වැව | 275.24 | 69.90 | 57.32 | 100.42 | 19.30 | 1.00 | 2.11 | 24.39 | 70.32 | 354.94 | 667.78 | 634.20 |
| කරබිඩංග වැව | 6.72 | 1.73 | 1.43 | 2.49 | 0.48 | 0.03 | 0.05 | 0.60 | 1.74 | 8.72 | 16.47 | 15.55 |
| කරුවලවංගුව | 32.56 | 9.66 | 7.76 | 13.18 | 3.31 | 0.89 | 0.90 | 3.08 | 9.12 | 42.44 | 82.55 | 74.69 |
| පුල්පතාන වැව | 41.26 | 10.64 | 8.75 | 15.28 | 2.97 | 0.16 | 0.34 | 3.67 | 10.71 | 53.51 | 101.07 | 95.44 |
| රොටවල වැව | 31.10 | 9.04 | 13.00 | 60.68 | 46.28 | 9.28 | 3.75 | 3.12 | 5.63 | 82.23 | 144.37 | 99.05 |
| මුවන් වැව | 0.32 | 2.12 | 6.49 | 35.71 | 31.34 | 4.41 | 1.00 | 1.38 | 3.48 | 53.20 | 45.77 | 17.95 |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මයිලැත්ත වැව | 3.77 | 4.56 | 10.30 | 72.13 | 77.03 | 7.51 | 1.86 | 2.22 | 5.51 | 103.17 | 111.56 | 35.52 |
| බැබව වැව | 297.63 | 62.21 | 56.01 | 274.12 | 236.62 | 41.03 | 19.48 | 12.64 | 41.24 | 463.36 | 983.28 | 1180.67 |

මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද ජල විද්‍යාත්මක තක්සේරු වාර්ථාව -2021

තවද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මෙම එල්ලංගාවේ සිදු කරන ලද ජල විද්‍යාත්මක තක්සේරුව අනුව එල්ලංගා පද්ධතියට ලැබෙන වර්ෂාවෙන් භූගත ජල සැපයුම, වාෂ්පීකරණය, වාෂ්පී උත්ස්වේදනය, වගාව සඳහා ප්‍රයෝජනයට ගැනීම යනාදියෙන් පසුව යල කන්නයේදී එල්ලංගාවේ අවසාන වැව වන බැබව වැවෙන් අක්කර අඩි 504.36 ක් ද මහ කන්නයේදී අක්කර අඩි 2686.92 ක් ද මුහුදට ගලා යයි. එහෙත් ව්‍යාපෘතිය මගින් වැව් පුනරුත්ථාපනය කිරීම සහ පවතින බෝග වගා රටාව වෙනස් කිරීම මගින් එම ප්‍රමාණය යල කන්නයේදී අක්කර අඩි 443.11 ක් සහ මහ කන්නයේදී අක්කර අඩි 2370.03 ක් දක්වා අඩු කර ගැනීමට සැලසුම් කර ඇත.

## 3.4 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

බැබව එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර වර්ග ලෙස වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකි වේ. මෙම ප්‍රදේශයේ පිහිටි වනාන්තරය නිමලව වනාන්තරය ලෙස හඳුන්වයි. මෙම වන කලාපය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිත වනාන්තරයකි. ඊට අමතරව මෙහි එක් කොටසක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වේ. තඹරව වැවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන පුරාවිද්‍යා භූමියක් වේ.

මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් සියඹලා, මයිල, පලු, වීර, දිවුල්, කරඳ හා කුඹුක් වැනි ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් අන්දර හා එරමිණියා විශාල වශයෙන් බහුලව පවතී. මීට අමතරව මෙම එල්ලංගාවේ යාල වනෝද්‍යානයට මායිම් වන කොටසේ සත්ව විශේෂ ලෙස ශ්‍රී ලංකා කොටියා, ශ්‍රී ලංකානු අලියා, වලසුන්, දිවියන්, මුවන්, ගෝනුන් හා වල් මීහරකුන් වැනි සතුන්ද ඉත්තෑවන්, මීමින්නන් වැනි කුඩා සතුන්ද දැකිය හැක.

මීට අමතරව උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැට කිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඩියා, අහර කුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද කටුසු වර්ග ලෙස පලා කටුස්සා, ගරා කටුස්සන්, අං කටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂද හූනු විශේෂ ලෙස සුලභ ගේ හූනන්, තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ. මෙම ප්‍රදේශයේ දුර්ලභ ගනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා, නිල් කිතලා, ලතුවැකියා, රත්මල් කිරලා දැකිය හැක. ආවේණික සතුන් ලෙස තරු ඉබ්බන් සිටියි. තවද වඳ වී යන සත්වයින් ලෙස කැබැල්ලෑවන්, හම්බාවන් එල්ලංගාව තුල ජීවත් වේ.

වනාන්තර වලින් ලබා ගන්නා සේවාවන් ලෙස මිනිසුන් දර කඩා ගැනීමට වනය නිතර භාවිතා කෙරේ. මීට අමතරව දිවුල්, පලු, වීර වැනි පලතුරු සොයාගැනීමට මිනිසුන් වනාන්තරය භාවිතා කරයි. සත්ව පාලනයේ යෙදෙන ගොවීන් තණකොල හා අනෙකුත් සතුන්ගේ ආහාර සඳහා සතුන් වනාන්තර වලට මුදා හරී. ඇතැම් පුද්ගලයින් වැලි හා පස් ලබා ගැනීමට මෙම වනාන්තර භූමි භාවිතා කරයි. ධීවර ප්‍රජාවට මිරිදිය මත්ස්‍යයින් අල්ලා ගැනීමට වනාන්තර ආශ්‍රිත වැව් භාවිතා කිරීමද සුලභව සිදු වේ.

එල්ලංගාව ආශ්‍රිතව පරිසර පද්ධතිය මානව ක්‍රියාකරකම් හේතුවෙන් බෙහෙවින් බලපෑමට ලක්ව ඇති බව නිරීක්ෂණය විය. වැව් ඉහත්තාවේ පෝෂක ප්‍රදේශයේ සිදුවන අනවසර හේන් වගාව නිසා පාංශු ඛාදනය අධික වී ඇත. විශේෂයෙන්ම හේන් වගාව නිසා පසේ ජලය උරා ගැනීමේ හැකියාව අඩු වී ඇති අතර ලැබෙන ජලය පස් ද සෝදා ගෙන පහලට ගමන් කරයි. මේ නිසා භූගත ජල මට්ටමද පහල ගොස් ඇත. එසේම විද්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව සිදු කරන මෙම අනවසර හේන් වගාවේ සී සෑම මගින් බිම් සකස් කිරීම නිසා වර්ෂාවත් සමඟ පස් සෝදාගෙන විත් ජලමාර්ග වල හා වැව් වල රොන්මඩ තැන්පත් වේ. විශේෂයෙන්ම එල්ලංගාවේ සිදු වන හේන් වගාව සඳහා කැලය කැපීම නිසා වනගහනය

ක්‍රමානුකූලව අඩු වෙමින් පවතී. හේන් වගාකරුවන්ගෙන් 50% කට වඩා වැඩි සංඛ්‍යාවක්, භූමි මාරු කරමින් හේන් වගාවේ නිරත වනු දක්නට ලැබුනි. හේන් වගාකරුවන් විසින් ස්වාභාවිකව ගලා යන ජල මාර්ග හරස් කර තම වගාවන්ට ජලය යොදා ගැනීම නිසා එල්ලංගාවේ ස්වාභාවික ලෙස ජලය ගලා යෑමට බාධා ඇති වී තිබේ.

වැලි කැපීම නීත්‍යානුකූල නොවන ආකාරයට අලිවල, තඹරව හා පූල්පතාන වැව් ආශ්‍රිතව සිදු කරයි. මෙය සීමාව ඉක්මවා සිදු කරන ක්‍රියාවලියක් වේ. සියලු මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතිය දිනෙන් දින විනාශ වෙමින් පවතී. නීත්‍යානුකූලව බොරළු කැපීම සඳහා බොරළු වලක්ද එල්ලංගාවේ පිහිටා ඇත. එසේම එල්ලංගාව තුළ තිස්සමහාරාමය ප්‍රාදේශිය සභාව විසින් ආරම්භ කර දැනට නතර කර ඇති අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ඇති අතර මෙමගින් පරිසරයට අපද්‍රව්‍ය එකතු වීම මෙන්ම ජලයට අපද්‍රව්‍ය එකතු වීමද සිදු වේ. එමෙන්ම අලි අතුන් විශාල සංඛ්‍යාවක් මෙම කුණුවල හි අපද්‍රව්‍ය ආහාරයට ගැනීමෙන් විවිධ ලෙඩ රෝග වලට ගොදුරු වීමද මරණයට පත් වීමද වාර්ථා වී ඇත.

එල්ලංගාව තුල වගා කරනු ලබන සෑම ඉඩමකටම විදුලි වැටවල් යෙදීම නිසා සතුන්ගේ ගමනාගමනයට බාධා වී ඇති අතර මේ නිසාම අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇත. එල්ලංගාවේ පෞද්ගලික කුඩා වැව් සාදා වගා කටයුතු සිදු කිරීම නිසා ප්‍රධාන වාරි වලට ලැබෙන ජලය අඩු වී ඇත. එසේම සෑම වැවකම වැව් රක්ෂිතය දක්වා වගා කර ඇති අතර මේ නිසා වැව ආරක්ෂාව සඳහා තිබූ ගස් ගොම්මන විනාශ වී ඇත. පුරාවිද්‍යාත්මක පුරාවස්තූන් බහුලව ඇති වැවක් ලෙස තඹරව වැව නම් කල හැකිය. එහි ඉහලෙහි සුසාන භූමියක් ඇති බව සඳහන් වේ. පුරාවිද්‍යාත්මක ස්ථාන වලට හානි කිරීම් වාර්තා නොවේ.

එල්ලංගාවේ සිදුවන කෘෂිකාර්මික ක්‍රම බොහෝමයක් දැකගත හැකිය. මෙහිදී හේන් වගාවන් බහුලව සිදු වේ. මෙහිදී සිදු වන වනාන්තර එළි පෙහෙලි කිරීම් එල්ලංගාවේ පැවැත්මට දැඩි තර්ජනයක් වී ඇත. හේන් වගාවන්ට අමතරව පොල් හා අඹ වගාවන් කිහිපයක් ද නිරීක්ෂණය විය. අලිවල හා මුවන් වැව ඉහල කොටසේ පොල් ගස් 20 – 30 ක් පමණ වූ පොල් වගාවක් ද අලිවල හා මයිල ගස් වැව අවට අක්කර 1 ක පමණ අඹ වගාවක් ද දැක ගත හැක. එසේම අලුත්වැව ප්‍රදේශයේ කෙසෙල් හා අඹ වගාවක් පවති. මයිල ගස් වැව ආශ්‍රිතවද අඹ හා පොල් වගාවක් පවතී.

මස් සඳහා සතුන් මැරීම ප්‍රදේශයේ සිදු වන අතර මේ වන විට සංඛ්‍යාත්මකව අඩු වී ඇති බව පෙනී යයි. හේන් සෑදීම සඳහා යොදා ගෙන අත්හරින ලද ඉඩම් වල ලඳු කැලෑව බහුලව පවතින නිසා වන සතුන්ද මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් වාසය කරයි. ගොවීන් විසින් එල්ලංගාවේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගෙන වෙනත් ප්‍රදේශ වල සිටින පුද්ගලයින් වෙත එම ඉඩම් විකිනීමේ ප්‍රවණතාවයක් ඇති බව දැන ගැනීමට ලැබුනි. මෙම ප්‍රදේශයේ ඛනිජ ද්‍රව්‍ය බහුලව ඇත. මැණික් සොයා පතල් කැපීම අමර වැව හා අලුත් වැව ප්‍රදේශයේ සිදුවන අතර ජලය හිඟකම නිසා පස් කපා එල්ලංගා පද්ධතියෙන් පිටතට රැගෙන යනු ලැබේ. මැණික් සොයා කණින ලද වලවල් රාශියක් හරස්කඩ චාරිකාවේදී නිරීක්ෂණය විය.

## 3.5 එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය (Human Livelihood) ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු

එල්ලංගාව තුල දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමි ප්‍රමාණය හෙක්ටයාර 4580 පමණ වුවද ඉන් කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර 1839 ක් පමණ යොදා ගෙන ඇත.

හේන් වගාව සඳහා යොදා ගෙන ඇති ඉඩම් සෑම මාස් කන්නයකම වගා නොකරන අතර දළ වශයෙන් හෙක්. 1200 ක් පමණ මාස් කන්නයේදී වගාව කරනු ලබයි. ඉතිරිය ලඳු කැලෑ වශයෙන් පවතී. එසේම දැනට වගා කරන ඉඩම් වල පමණක් හේන් වගා කිරීමට අවසර ලබාදෙන නමුදු ගොවීන් අනවසරයෙන් වනාන්තර එලිපෙහෙලි කර හේන් වගාව සඳහා යොදා ගැනීම නිසා එල්ලංගාවේ වනාන්තර බිම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. විශේෂයෙන්ම මුලු හේන් වගා බිම් ප්‍රමාණයෙන් 2% ක් පමණ අලුතින් වනාන්තර එලිපෙහෙලි කර වගා කරන ඉඩම් වේ. හේන් වගා ඉඩම් වල රටකජු හා මුං ඇට ප්‍රධාන වශයෙන් වගා කරන අතර මීට අමතරව මිරිස් වගාවද දක්නට ලැබේ. කෘෂි කාර්මික ඉඩම් පරිහරණය රටාව ගත් විට මාස් කන්නයේ හේන් වගාව සිදු කරනු ලබන අතර යල කන්නයේ ජලය හිඟ වීම නිසා හේන් වගාව සිදු කරනු නොලබයි. එල්ලංගා පද්ධතියට අයත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත ඉඩම් වල කිසිදු අනවසර අල්ලා ගැනීමක් දක්නට නොලැබීම විශේෂිත කරුණකි. විශේෂයෙන්ම හේන් වගාවේදී කිසිදු පාංශු සංරක්ෂණ ක්‍රමයක් භාවිතා නොකරන බැවින් එය එල්ලංගාවේ විශාල පාරිසරික ගැටළුවක් බවට පත් වී ඇති අතර එය එල්ලංගාවේ පැවැත්ම කෙරේ බෙහෙවින් බලපා ඇත. මෙය එල්ලංගාවේ පැවැත්ම කෙරේ බලපා ඇති විශාල තර්ජනයක් වන අතර කඩිනමින් අවිධිමත් හේන් වගාව විධිමත් කෘෂිකාර්මික ක්‍රම යටතේ සූක්ෂම බෝග වගා රටාවක් දක්වා වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. වැව් වලින් අනවසරයෙන් ජලය ලබාගෙන වගා කිරීමක් සිදු නොවන අතර මහ කන්නයේදී වැව් වලට ජලය ලැබෙන ජලමාර්ග වලින් වතුර පොම්ප භාවිතා කර ජලය ලබාගෙන මිරිස් වැනි බෝග වර්ග වගා කරනු ලබයි. මේ නිසා වැව් වලට ලැබෙන ජල ප්‍රමාණය අඩුවේ.

එල්ලංගා පද්ධතියේ පලු ගස්, පලු කැඩීම සඳහා විශාල අතු කැපීම නිසා විශාල තර්ජනයකට ලක් වී ඇත. විශාල පලු අතු කපා බිම හෙලා පලු කඩන අතර එවැනි අතු නැවත විශාල වීම සඳහා දල වශයෙන් අවුරුදු 30 ක් වත් ගත වනු ඇත. පලු ගස් වල ගෙඩි කඩන කාලයට දිනකට පුද්ගලයින් 400 ක් පමණ එල්ලංගා පද්ධතියට ඇතුලු වී පලු කඩන බව ගොවි සංවිධාන පවසයි. හරස්කඩ චාරිකාවේදී එවැනි කණ්ඩායම් කීපයක්ම මුනගැසුනු අතර ඔවුන් අතර ගෙවල් වල කෑමට පලු කඩන අය මෙන්ම ජීවනෝපාය ලෙස අලෙවි කිරීමට පලු කඩන අයද විය. විශේෂයෙන් පලු ගස් විශාල සංඛ්‍යාවක් එල්ලංගා පද්ධතිය තුල

ඇති අතර කි.මී. 10 කට වඩා දුර සිට කණ්ඩායම් පැමිණ පලුකැඩීම සිදු කරයි. හරස්කඩ චාරිකාව සඳහා ගමන් ගත් මාර්ගයේ බොහෝ ගස් වල අතු කපා පලු කඩා තිබෙන අයුරු නිරීක්ෂණය විය. එහෙත් වනජීවි කලාපය තුල තිබෙන පලු ගස් මෙවැනි තර්ජනයට ලක් නොවේ. තවද කණ්ඩායම් ලෙස පලු කැඩීමට පැමිණීම විනෝදාංශයක් මෙන්ම සංස්කෘතියක් බවට පත් වී ඇති නිසා මෙය එල්ලංගාවේ ඉදිරි පැවැත්ම කෙරේ විශාල තර්ජනයක් වී ඇත.

නිදැල්ලේ හැසිරෙන ගව රංචුවක්

නිදැල්ලේ ගවයින් ඇති කිරීම එල්ලංගාවේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇති අතර එල්ලංගාව තුල එළ ගවයින් හා මී ගවයින් 2000 ක් පමණ සිටින බව හරස්කඩ චාරිකාවේදී නිරීක්ෂණය විය. මෙම නිදැල්ලේ ඇති කරන ගවයින් නිසා වැව් වල රොන්මඩ තැන්පත් වීම, ජලජ ශාක වර්ධනය මෙන්ම වැව් කණ්ඩි හා ඇළවල් විනාශ වීමටද ලක් වේ.

වැව් පිටියෙහි ඇති ගවගාලක්

විශේෂයෙන්ම වැව් තුලම ගවගාල් ඉදිකර සත්ව පාලන කටයුතු කරන අතර මෙවැනි ගාල් 3 ක් තඹරව වැවේද, ගාල් 4 ක් රොටවල වැවේද, ගාල් 4 ක් පුල්පතාන වැවේද, ගාල් 2 ක් බැබව වැවේ ද, ගව ගාල් 4 ක් මුවන් වැවේ ද, ගාල් 3 ක් මයිලැත්ත වැවේ ද, හැළඹ වැවේ ගව ගාල් 3 ක් හා අලි වල වැවේ ගව ගාල් 2 ක්ද හරස්කඩ චාරිකාවේ දී දක්නට ලැබුනි.

## 3.6 සමාජ ආර්ථික (Socio - Economic) තොරතුරු

බැබව එල්ලංගාව තුල මුල් කාලයේදී මිනිසුන් පදිංචි වී සිට ඇති අතර පසුව ඇතිවූ දීර්ගකාලීන නියඟයක් නිසා මිනිසුන් ගම්මාන අත්හැර දමා වෙනත් ප්‍රදේශ වලට පදිංචියට ගොස් ඇත. ඉන්පසුව එල්ලංගාව මිනිසුන් තොර ප්‍රදේශයක් බවට පත් වී ඇති අතර 2005 දී පමණ මෙම ප්‍රදේශය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට පත් වී ඇත. ඉන්පසුව එතෙක් කෘෂිකර්මාන්තය කරගෙන ආ අයට තම කුඹුරු ඉඩම් වල කෘෂිකර්මය කිරීමට අවසරය ලැබී ඇති අතර ස්ථිර පදිංචියට අවස්ථාව ලැබී නොමැත. කෙසේ වෙතත් මේ වනවිට පවුල් 15 ක් පමණ පදිංචි වී ඇති අතර පවුල් 2100 ක් පමණ කෘෂිකාර්මික කටයුතු සඳහා එම කටයුතු සිදු කරන කාලවලදී එල්ලංගාවට පැමිණේ. කෘෂිකාර්මික කටයුතු සිදුකරන කාලයේදී තාවකාලික පැල්පත් සාදා ගෙන ගොවීන් පමණක් රාත්‍රී කාලය ගත කරන අතර අස්වනු නෙලා ගැනීමෙන් පසුව ඉවත්ව යයි. වැව් වල ජලය තිබෙන යල කන්න වලදී මුං හෝ වෙනත් කෙටි

කාලීන බෝග වැව් යටතේ වගා කරන අතර ඒවා වගා කරන ගොවීන් එම කාලයේද එල්ලංගාව තුල පදිංචි වී සිටී.

මාස් කන්නයේදී ගොවීන් 2100 ක් පමණ වැව් යටතේ ඇති කුඹුරු ඉඩම් වල, ජල ධාරා ප්‍රදේශ වල වගා කරන අතර වගා කරන ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්. 1200 ක් පමණ වේ. විශේෂයෙන්ම වැව් රක්ෂිත වල හා ජලමාර්ග ප්‍රදේශ වල මෙම ගොවීන් හේන් වගාවේ නිරත වන අතර මේ නිසා පෝෂිත ප්‍රදේශ මෙන්ම වැව් ද විශාල තර්ජනයට ලක් වී ඇත. හේන් වගාව බිම් මාරු ක්‍රමයට සිදු වන අතර එකම ඉඩමේ දීර්ඝ කාලයක් වගා කරන ගොවීන් ප්‍රමාණය ඉතා අඩුය. එසේම අලුතින් කැලෑ කපා හේන් වගාව සඳහා ඉඩම් එකතු කර ගැනීමද සිදුවේ. හේන් වගාව මෙම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන බැවින් එය විධිමත්භාවයට පත් කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත.

<u>චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාස</u>

බැබව එල්ලංගා පද්ධතිය අයත් බිම් කඩ කතරගම පුදබිමේ එක් කෙලවරක පිහිටා වැඩිහිටි කන්දට දකුණු පැත්තට වන වනතීරයේන් ආරම්භ වෙයි. එබැවින් එය කතරගම දෙවියන්ගේ අඩවියට අයත් ප්‍රදේශයක් නිසා එහි වෙසෙන මිනිසුන්ගේ ආරක්ෂකයා වන්නේ කඳ සුරිඳු හෙවත් කන්ද කුමාර හෙවත් කතරගම දෙවියෝය. එබැවින් සිය බව භෝග මෙන්ම ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා කඳසුරිඳු වෙනුවෙන් කරන පුදපූජා විධි හා යාතිකර්ම මෙහි පවතියි.

<u>මඩ දානය</u>

වී වපුරා මාසයක් ඉක්මවූ තැන දෙවියන් වෙනුවෙන් ලබාදෙන දානයකි. බව බෝග වලට හා ගොවීන්ගේ ජීවිත වලට සිදුවිය හැකි අතුරු ආන්තරා අවම කිරීමට මෙම දානය දෙවියන්ට පිරිනමයි. එම දානය දෙන දිනය තීරණය කරනු ලබන්නේ කන්න රැස්වීම දිනට වන අතර ඒ තුලින් ගම්‍ය වන තවත් සැඟවුනු අරමුණක් වන්නේ සෑම ගොවියකුම එකම කාලසීමාවක වගා කටයුතු ආරම්භ කල යුතු බවයි.

එයට අමතරව හේන් හා කුඹුරු අස්වැන්න නෙලා ගත් පසුව පුද්ගලිකව හෝ යාය වශයෙන් සංවිධානය වී කැලෑ සතුනට හා දෙවියන් උදෙසා දේව දානය සිදු කරයි. මෙම දානය සඳහා පැණි කිරිබත් හා නෙලාගන්නා ලද තල, මුං, කවුපි ආදී බව බෝග වර්ගද එකතු කරයි. එහි මුල් කොටස දෙවියන්ට පූජා කර ඉතිරි කොටස සමූහයා විසින් බුක්ති විඳිති.

## 3.7 එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් (Constructions) කටයුතු පිලිබඳ තොරතුරු

එල්ලංගාව තුල පිහිටි බැබව, තඹරව, හැළඹ වැව, රොටවලවැව, කරුවලවංගුව, කරබිඩංග, මයිලිත්තන් වැව, මුවන් වැව, බැන්දු වැව, පුල්පතාන යන වැව් ලෝක බැංකු ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් 2023 වර්ෂයේ සිට පුනරුත්ථාපනය කරමින් පවතී. මේ සඳහා රුපියල් මිලියන 748.39 ක් වෙන් කර ඇත. එල්ලංගාව වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගැනෙන භූමි භාගයක පිහිටා ඇති බැවින් දැනට අලුතින් ඉදිකිරීම් කටයුතු සිදු නොවේ. එහෙත් දැනටමත් ඇති කඳවුරු භූමි වල අනවසර ඉදිකිරීම් සිදුවෙමින් පවතින බව හරස්කඩ චාරිකාවේදී නිරීක්ෂණය විය. වගා කටයුතු සිදු කරන ප්‍රදේශයේ සෑම ඉඩමකම වාගේ විදුලි වැටවල් ඉදි කර ඇති අතර ඒවායේ දිග සංඛ්‍යාත්මකව ගණනය කල නොහැක. විශේෂයෙන්ම මෙම විදුලි වැටවල් නිසා වන අලින් ඇතුලු වන සතුන්ගේ ගමනාගමනයට විශාල වශයෙන් බාධා ඇති වී ඇති අතර එම නිසාම තාවකාලික විදුලි වැටවල් වලට හානි කිරීමද වැඩි වී ඇත.

## 3.8. එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා (Cropping Patterns) පිළිබඳ තොරතුරු

බැබව එල්ලංගාව පද්ධතිය තුල වැව් වල සහ පෞද්ගලික වැව් යටතේ හෙක්.275 ක් පමණ වගා කරන අතර එම වැව් යටතේ කෘෂි කටයුතු වල යෙදෙන ගොවි පවුල් සංඛ්‍යාව 375 ක් පමණ වේ. මීට අමතරව හේන් වගා හා බහු වාර්ෂික බෝග වගා කරන ගොවීන් සංඛ්‍යාව 1725 ක් පමණ වේ. බහු වාර්ෂික බෝග ලෙස හෙක්ටයාර 15 ක පමන කෙසෙල්, පොල් හා අඹ වගාවන් එල්ලංගාවේ ප්‍රධාන පාංශු කාණ්ඩය රතු දුඹුරු පස වන අතර ඊට අමතරව වැලි මිශ්‍ර ලොම් පස් හා බොරළු සහිත ගල් සහිත ප්‍රදේශයන්ද දැකිය හැක. මුළු පද්ධතියට අයත් භූමි ප්‍රමාණයෙන් 28% ක් පමණ වගා කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර 82% ක් පමණ කැලෑ හා ලඳු කැලෑ වේ.

එල්ලංගාවේ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය අඟල් 675 ක් වන අතර පසුගිය වසර 10 ක වර්ෂාපතන රටාව සැලකූ විට යල කන්නයට අඩු වර්ෂාපතනයකුත් මහ කන්නයට සාපේක්ෂව වැඩි වර්ෂාපතනයක්ද බොහෝ ප්‍රදේශවලට ලැබී ඇත. එල්ලංගා පද්ධතිය තුල වගා කටයුතු සිදු කරනු ලබන ප්‍රධාන වැව් 14 ක් ඇති අතර ඉන් වැව් 13 ක මහ කන්නයේ ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබුනු පසු වී වගාව කිරීමත්, අලුත් වැවේ කෙසෙල්, පොල් වැනි බහු වාර්ෂික බෝග වගාවත්, ගොඩ ඉඩම් ප්‍රදේශවල හෙක් 1549 ක් පමණ හේන් වගාවත් සිදු කරනු ලබයි. හේන් වල ප්‍රධාන වශයෙන් කුරක්කන්, මුං, කව්පි, රටකජු, තල වැනි බෝග වගා කරන අතර මීට අමතරව මිරිස් හා එළවළු වර්ගද හේන් තුල වගා කරනු ලබයි. මහ කන්නය තුල වගා කරන භූමියෙන් 85% ක් පමණ හේන් වගා කරනු ලබන අතර 15% ක් පමණ වී වගාව කරනු ලබයි.

ජලය ප්‍රමාණවත් නොවීම නිසා යල කන්නයේදී එල්ලංගාවේ වැව් යටතේ වී වගාව කරනු ලබන බිම් ප්‍රමාණය අඩුවන අතර එම කුඹුරු ඉඩම් වල මුං ඇට, රටකජු, කව්පි වැනි බෝග බහුල වශයෙන් වගා කෙරේ. එසේම ජල හිඟය නිසා මහ කන්නයේ පවා කුඹුරු ඉඩම් වල වගා කිරීමට නොහැකි වී ඇති අතර පසුගිය වසර 3 ක බෝග වගා රටාව පහත වගු අංක 7 හි දක්වා ඇත.

වගු අංක 7 : පසුගිය කන්න 6 තුල එල්ලංගාව තුල පිහිටි වැව් වල බෝග වගා රටාව

| අනු අංක | වැව | 2023 යල (අක්කර) | | 2022/23 මහ (අක්කර) | | 2022 යල (අක්කර) | | 2021/22 මහ (අක්කර) | | 2021 යල (අක්කර) | | 2020/21 මහ (අක්කර) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග |
| 1 | තඹරව වැව | 0 | 54 | 0 | 62 | 0 | 62 | 62 | 0 | 0 | 62 | 62 | 0 |
| 2 | බැන්දූ වැව | 0 | 8 | 0 | 10 | 0 | 8 | 57 | 0 | 0 | 0 | 57 | 0 |
| 3 | හැළඹ වැව | 0 | 11 | 12 | 0 | 0 | 12 | 12 | 12 | 0 | 12 | 12 | 0 |
| 4 | කරපිඩංග වැව | 0 | 5 | 5 | 0 | 0 | 3 | 5 | 0 | 0 | 0 | 5 | 0 |
| 5 | කරුවලවංගුව වැව | 0 | 3 | 3 | 0 | 0 | 1 | 11 | 0 | 0 | 3 | 5 | 0 |
| 6 | මයිලගස් වැව | 6 | 0 | 6 | 0 | 0 | 4 | 6 | 0 | 0 | 6 | 6 | 0 |
| 7 | රොටවල වැව | 0 | 26 | 26 | 0 | 0 | 4 | 26 | 0 | 0 | 0 | 26 | 0 |
| 8 | ජුල්පතාන වැව | 0 | 21 | 0 | 0 | 0 | 21 | 21 | 0 | 0 | 21 | 0 | 0 |
| 9 | අලිවල වැව | 0 | 0 | 5 | 0 | 0 | 0 | 5 | 0 | 4 | 0 | 3 | 0 |
| 10 | මලිත්තන් වැව | 0 | 0 | 2 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 2 | 0 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | බැබව වැව | 0 | 0 | 24 | 0 | 0 | 0 | 24 | 0 | 0 | 0 | 24 | 0 |
| 12 | මුවන් වැව | 0 | 2 | 12 | 0 | 0 | 0 | 12 | 0 | 0 | 0 | 12 | 0 |
| 13 | මයිලත්ත වැව | 0 | 8 | 0 | 0 | 0 | 0 | 14 | 0 | 0 | 0 | 14 | 0 |
| | එකතුව | 6 | 138 | 95 | 72 | 0 | 115 | 257 | 12 | 4 | 104 | 228 | 0 |

මූලාශ්‍රය - ගොවි සංවිධාන/යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය

ඉහත වගුව පසුගිය වසර 3 තුල සියලුම වැව් යටතේ මහ කන්නයේ වගා කර ඇත්තේ 2021/22 මහ කන්නයේ පමණි. එසේම යල කන්නයේ අතිරේක ආහාර බෝග වගාවක් සිදු කරන අතර අතිරේක බෝග වගාවද මුලු වගා බිම් ප්‍රමාණයේම සිදු කර නැත. තවද වර්ෂාව ප්‍රමාණවත් නොවීම, මනා ජල කළමණාකරනයක් නොමැති වීම සහ එල්ලංගාවේ ජල පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවක් සිටීම නිසා සෑම කන්නයක්ම, අඛණ්ඩව වගා කිරීමට නොහැකි වී ඇත.

එසේ වුවද වාරිමාර්ග පුනරුත්ථාපනය, ජල කළමණාකරනය, දේශගුණ සුහුරු කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සහ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම මගින් ඉහත බෝග වගා රටාව වෙනස් කිරීමට දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අපේක්ෂා කරන අතර යෝජිත බෝග වගා රටාව පහත වගු අංක 8 හි දැක්වේ.

වගු අංක 8 : දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් වැව් පුනරුත්ථාපනයෙන් පසු යෝජිත බෝග වගා රටාව

| අනු අංක | වැව | වගා බිම් ප්‍රමාණය (හෙක්) | යල කන්නයේ වගා කිරීමට යෝජිත බෝග වර්ග හා බිම් ප්‍රමාණය (හෙක්) | | | | | මහ කන්නයේදී වගා කිරීමට යෝජිත බෝග වර්ග හා බිම් ප්‍රමාණය (හෙක්) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | මුං | මිරිස් | කව්පි | රටකජු | සෝයා | වී |
| 1 | තඹරව වැව | 62 | 19 | 25 | 6 | 6 | 6 | 62 |
| 2 | බැන්දු වැව | 57 | 11 | 28 | 6 | 6 | 6 | 57 |
| 3 | හැලබ වැව | 12 | 4 | 4 | 2 | 1 | 1 | 12 |
| 4 | කරබිංඩංග වැව | 5 | 2 | 1 | 1 | | 0 | 5 |
| 5 | මයිල ගස් වැව | 6 | 4 | | 2 | | | 6 |
| 6 | කරුවලවංගුව | 11 | 4 | 4 | 1 | 1 | 1 | 11 |
| 7 | රොටවල වැව | 26 | 12 | 6 | 5 | 1 | | 26 |
| 8 | පුල්පතාන වැව | 21 | 14 | 2 | 2 | 2 | 1 | 21 |
| 9 | අලිවල වැව | 5 | 4 | 1 | | | | 5 |
| 10 | මුවන් වැව | 12 | 5 | | 4 | 3 | | 12 |
| 11 | මයිලත්ත වැව | 14 | 4 | 6 | 3 | 1 | | 14 |
| 12 | බැබව වැව | 24 | 12 | 5 | 7 | | | 24 |
| 13 | මලිත්තන් වැව | 2 | 2 | | | | | 2 |
| | එකතුව | 257 | 97 | 82 | 39 | 21 | 15 | 257 |

මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද ජල විද්‍යාත්මක තක්සේරු වාර්ථාව

## 3.9. එල්ලංගාවේ වාරිමාර්ග කළමණාකරනය (Irrigation Management) පිළිබඳ තොරතුරු

එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් 14 ක් යටතේ සහ පෞද්ගලික කුඩා වැව් 12 ක් පමණ යටතේ වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වී වගා කරන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාව සිදු කරනු ලබයි. මහ කන්නයේද අඛණ්ඩව වගාවන් සිදු නොවන අතර සමහර වැව් වල කන්න ගණනාවක් මහ කන්නයේදී පවා වගා කර නොමැත. විශේෂයෙන්ම ගංගා දෝණියට ලැබෙන ජලය සංවර්ධනය කර තිබෙන වැව් වල ප්‍රමාණයට ප්‍රමාණවත් නොවීම නිසා මහ කන්නයේද වගාව සිදු කිරීමට අපහසු වී ඇත.

දැනට එල්ලංගාවේ පිහිටි සෑම වැවකම ජලය බෙදා දීම මුර ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර ඒ අනුව එක් එක් ගොවියාට පැය කිහිපයක් පමණක් ජලය ලබාදේ. ඒ අනුව බැන්දූ වැව සතියකට පැය 2 ක්ද, කරුවලවංගුව වැව සතියකට පැය 3 ක්ද, රොටවල වැව දින 10 කට වරක් පැය 2 ක්ද, ජූල්පතාන වැව යටතේ සතියකට පැය 2 ක්ද වශයෙන් එක් ගොවියකුට ජලය ලබාදීමේ මුර ක්‍රමයක් පවතියි. ජල පාලක විසින් මෙම පැය ගණන අවසන් වූ පසුව වගාවට ජලය ලබාදීම නතර කරනු ලබයි. ජල හිඟය නිසාම ජල පාලකගේ මැදිහත් වීම මත ජල කළමණාකරන කටයුතු සාර්ථකව සිදු කරනු ලබයි. එල්ලංගා පද්ධතියේ වැව් 10 ක් යටතේ ගොවි සංවිධාන 10 ක් ඇති අතර වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින් ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාත්මක වන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත.

විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ කරයි. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. ජලය බෙදා හැරීමේ ගැටළු විසඳීම සඳහා ගොවි සංවිධාන මැදිහත් වන අතර මුර ක්‍රමය මත පැය ගණනකට ජලය ලබා දීම නිසා ජලය බෙදා හැරීම ආශ්‍රිත ගැටළු අඩුවී ඇත. ගොවීන් එල්ලංගාව තුල පදිංචි වී නොමැති නිසා ජලය අඩු වූ අවස්ථා වලදී බෙත්ම ක්‍රමයට වගාවක් සිදු නොවන අතර මුං ඇට වැනි ජලය අඩුවෙන් අවශ්‍ය බෝග වර්ග පමණක් වගා කරයි. දැනට වැව් වල පස් ඇළ වල් තිබෙන බැවින් ජලය අපතේ යාම වැලැක්වීමට නොහැකි වී ඇති අතර ජලය අවශ්‍ය පරිදි පාලනය කර බෙදා දීමටද නොහැකි වී ඇත. රොටවල වැව, බැබව වැව, බැන්දූ වැව, තඹරව වැව, මයිලැත්ත යන වැව් වල ජල පාලන නිර්මිත ඇත.

## 3.10.පෝෂක ප්‍රදේශයේ (Command Area) වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු

එල්ලංගාවේ වැව් යටතේ වගා කිරීම සඳහා සැලසුම් කර ඇති ඉඩම් ප්‍රමාණයට වඩා බොහෝ වැව් යටතේ වගා කර ඇති නමුදු එය සමස්ථයක් ලෙස ගත් කල 5%ක පමණ වැඩිවීමකි. එසේම බැබව යටතේ තිබූ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 50% ක් පමණ වනජීවී කලාපයට ඇතුලත් වීම නිසා පෝෂක ප්‍රදේශය අඩු වී ඇත. එල්ලංගාවේ එක් එක් වැව යටතේ වගා කිරීමට සැලසුම් කර ඇති ඉඩම් ප්‍රමාණය සහ දැනට සංවර්ධනය කර ඇති ඉඩම් ප්‍රමාණය පහත වගු අංක 9 යටතේ දැක්වේ.

වගු අංක 9 - එක් එක් වැව යටතේ සැලසුම් කරන ලද වගා ඉඩම් ප්‍රමාණය සහ දැනට වගා කරන ඉඩම් ප්‍රමාණය

| වැව | සැලසුම් කරන ලද බිම් ප්‍රමාණය (හෙක්) | දැනට වගා කරන බිම් ප්‍රමාණය (හෙක්) |
|---|---|---|
| තඹරව වැව | 50 | 62 |
| බැන්දූ වැව | 48.5 | 57 |
| හැළඹ වැව | 11 | 11 |
| කරපිඩංග වැව | 05 | 05 |

| | | |
|---|---|---|
| මයිලගස් වැව | 06 | 06 |
| කරුවලවංගුව වැව | 12.9 | 11 |
| රොටවල වැව | 18.6 | 26 |
| පූල්පතාන වැව | 17.8 | 21 |
| අලිවල වැව | 03 | 05 |
| මුවන් වැව | 12 | 12 |
| මයිලත්ත වැව | 30 | 14 |
| බැබව වැව | 48.5 | 24 |
| මලිත්තන් වැව | | 2 |
| එකතුව | 245.5 | 257 |

මූලාශ්‍රය - ගොවි සංවිධාන / යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය

කුඹුරු වල ලවණතාවය වැඩිවීම හා වනජීවී කලාපයට ඇතුලත් වීම නිසා බැබව වැවේ වගා ඉඩම් ප්‍රමාණය අඩු වී ඇති අතර ජලය ප්‍රමාණවත් නොවීම නිසා කරපිඩංග වැවේ වගා බිම් ප්‍රමාණය අඩු වී ඇත. ජලය බෙදා හැරීමේ ඇල මාර්ග පස් වලින් සකස් කර ඇති බැවින් ජලය ගලා යාමේ වේගය ඉතා අඩුවී ඇති අතර අපතේයාමද වැඩි වී ඇත. විශේෂයෙන්ම වැව් වල වාරිමාර්ග ඇලවල් මෙන්ම නිර්මිත වලටද විශාල වශයෙන් හානි සිදු වී ඇත. එක් එක් වැව යටතේ ඇති ඇලවල්, ඒවායේ දිග සහ වගා බිම් ප්‍රමාණය පහත වගු අංක 10 හි දැක්වේ.

වගු අංක 10 - ජලය බෙදා හැරීමේ ඇලවල් හා වගාබිම් ප්‍රමාණයන්

| අනු අංක | වැව | ඇල | දිග (මීටර්) | වගා බිම් ප්‍රමාණය (අක්) |
|---|---|---|---|---|
| 1 | තඹරව වැව | ගොඩ දොර<br>වල දොර | 200<br>400 | 8<br>54 |
| 2 | හැළඹ වැව | ගොඩ දොර<br>වල දොර<br>අතිරේක දොර | 300<br>200<br>200 | 5<br>5<br>2 |
| 3 | කරපිඩංග වැව | බෙදුම් ඇල | 250 | 5 |
| 4 | කරුවලවංගුව වැව | ගොඩ දොර<br>වල දොර | 50<br>150 | 3<br>8 |
| 5 | මයිලගස් වැව | ඇල | 150 | 6 |
| 6 | රොටවල වැව | ගොඩ දොර<br>වල දොර | 800<br>300 | 18<br>8 |
| 7 | බැබව වැව | බෙදුම් ඇල 1<br>බෙදුම් ඇල 2<br>බෙදුම් ඇල 3 | 500<br>600<br>150 | 10<br>13<br>1 |
| 8 | මුවන් වැව | වම් ඇල<br>දකුණු ඇල | 500<br>700 | 4<br>8 |
| 9 | මයිලැත්ත වැව | ගොඩ දොර<br>වල දොර | 1510<br>1500 | 14<br>8 |
| 10 | පූල්පතාන වැව | බෙදුම් ඇල | 3500 | 21 |
| 11 | බැන්දු වැව | බෙදුම් ඇල 1<br>බෙදුම් ඇල 2 | 1000<br>1500 | 22<br>35 |
| 12 | අලිවල වැව | බෙදුම් ඇල | 300 | 5 |
| | එකතුව | | | 257 |

මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ඉංජිනේරු සමීක්ෂණය (2022)

අපවහන ඇළවල් නිසියාකාරව නඩත්තු නොකිරීම සහ බොහෝ අපවහන ඇලවල් ගොවීන් විසින් අල්ලා ගැනීම නිසා නියමිත පරිදි අපවහන ජලය බැස නොයෑම නිසා සමහර කුඹුරු ඉඩම් වල ලවණතාවය ඉහල ගොස් ඇත. බැබව වැවේ හෙක්ටයාර 20 ක් පමණද, තඹරව වැවේ හෙක්ටයාර 04 ක් පමණද, බැන්දු වැවේ හෙක්ටයාර 02 ක් පමණද, පූල්පතාන හෙක්ටයාර 03 ක් පමණද, මලිත්තන් වැව හෙක්ටයාර 01 ක් පමණද, මුවන් වැවේ හෙක්ටයාර 2.5ක් පමණද, හැළඹ වැවේ හෙක්ටයාර 01ක් පමණද, රොටවල වැවේ හෙක්ටයාර 02 ක් පමණද, කරබිඩංග වැවේ හෙක්ටයාර 01 ක් පමණද, අලිවල වැව හෙක්ටයාර 01ක් පමණද, ලවණතාවයට ලක් වී ඇත.

## 04. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

බැබව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග පහත දැක්වේ. ( I ) හේන් වගාව නිසා පාංශු ඛාදනය සහ වැව් වල රොන්මඩ තැන්පත් වීම (ii) ජල පෝෂක ප්‍රදේශ වල සහ ජලධාරා ප්‍රදේශයේ සිදුකරන හෙක් 1549 ක් පමණ වන අනවසර හේන් වගාව වර්ධනය විම (iii) මැණික ගැරීම, වැලි ඉවත් කිරීම හා පස් කැපීම (iv) කඳවුරු භූමි පවත්වාගෙන යාම (v) කට්ටකඩුව, ගස් ගොම්මන ආදී සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධති විනාශ වීම (vi) හේන් වගාව සඳහා කැලෑ කැපීම නිසා වන ගහනය අඩු වීම (vii) එල්ලංගාව තුල ගවයින් 2000 ක් පමණ නිදැල්ලේ ඇති කිරීම සහ ගවගාල් 22 ක් පමණ වැව් පිටිවල ඉදිකර තිබීම නිසා වැව් කණ්ඩි සහ ඇල ඉවුරු වලට හානි සිදුවීම. වැව්වල රොන්මඩ තැන්පත් වීම හා ජලජ ශාක වර්ධනය වීම (viii) වැව්, වාරි ඇල මාර්ග සහ නිර්මිත මනාව නඩත්තු නොකිරීම (ix) ජල කළමණාකරනය කිරීම සහ වාරි පද්ධති නඩත්තු කිරීම සඳහා පිහිටුවා ඇති ගොවි සංවිධාන අපේක්ෂිත මට්ටමින් ක්‍රියාකාරී නොවීම (x) වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ වීම (xi ) අපවහන ඇලවල් නිසිලෙස නඩත්තු නොකිරීම නිසා කුඹුරු වල ලවණතාවය ඉහල යාම (වර්තමානයේ හෙක් 37 ක් පමණ ලවණතාවයට ලක්වී ඇත) (xii) එල්ලංගාවේ සෑම වැවකටම වාගේ වැව් රක්ෂිත නොමැති නිසා වැව් වල රොන්මඩ තැන්පත් වීම ඉහල යාම (xiii) වර්ෂාව ප්‍රමාණවත් තරම් නොලැබීම හේතුවෙන් ඇති වී ඇති උග්‍ර ජල හිඟය නිසා වැව් යටතේ යල මහ වගාකිරීමට නොහැකි වීම (xiv) තිස්සමහාරාමය ප්‍රාදේශීය සභාව විසින් එල්ලංගාව තුල පවත්වාගෙන ගොස් දැනට නතර කර දමා ඇති කසල බැහැර කිරීමේ මධ්‍යස්ථානය පරිසරයට නිරාවරණය වී පැවතීම නිසා ජලයට අපද්‍රව්‍ය එකතුවීම හා පොලිතීන් වර්ග පරිසරයට එකතුවීම (xv) පලුවාරයට ගෙඩි කැඩීම සඳහා දිනකට විශාල සංඛ්‍යාවක් එල්ලංගාවට ඇතුලු වී පලුගස් වල විශාල අතු බිම හෙලා පලු ගෙඩි කැඩීමයි.

### 4.1 එල්ලංගාවේ උග්‍ර ගැටළු (Critical Issues)

**එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා කඩිනමින් අවධානය යොමු කල යුතු යැයි තීරණය කරන ලද මැදිහත්වීම ඇතුලත් ගැටළු, උග්‍ර ගැටළු ලෙස හඳුනා ගන්නා ලදී. ඒවා එල්ලංගාවේ ප්‍රධාන අභියෝග අතුරින් සහ එල්ලංගා පැතිකඩේ සඳහන් දත්ත හා තොරතුරු ආශ්‍රයන් හඳුනාගන්නා ලදී. සැලසුම්කරුවන් ගැටළු ගස (**Problem Tree**) නැමැති සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කර ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ එකතු වී සහභාගීත්ව හා තාත්වික ආකාරයට උග්‍ර ගැටළු හඳුනා ගන්නා ලදී. මෙම උග්‍ර ගැටළු පහත වගු අංක 11 හි සංෂිප්තව දක්වා ඇත.**

වගු අංක 11 - එල්ලංගාවේ උග්‍ර ගැටළු

| අනු අංක | උග්‍ර ගැටළුව | උග්‍ර ගැටළුවේ විෂය ක්ෂේත්‍රය |
|---|---|---|
| 1 | ප්‍රදේශයේ ගොවි පවුල් 375 ක් පමණ හෙක්ටයාර් 275 ක් පමණ වූ තම කෘෂි භූමි ජල හිඟය නිසාවෙන් දෙකන්නයේම ප්‍රමාණවත්ව වගා කිරීමට නොහැකිව ජල දරිද්‍රතාවයට (Water Poverty) ලක්වීමේ අවදානමට පත්වෙමින් සිටීම. | කෘෂි ජල හිඟය |
| 2 | වන රක්ෂිතය තුල ඇති ස්වාභාවික ජලමාර්ග අවහිර කොට අනවසරයෙන් පෞද්ගලික කුඩා වැව් තනා එමගින් නව ජල මාර්ග ඔස්සේ වගා බිම් වලට ජලය ලබා ගැනීම හේතුවෙන් එල්ලංගාවේ විධිමත් වැව් පද්ධතියට ජලය ලැබීම අඩු වීම. | ස්වාභාවික ජල මාර්ග අනවසරයෙන් අවහිර කිරීම |
| 3 | වන රක්ෂිතය තුල නිදැල්ලේ හැසිරෙන සහ වැව් පිටිවල තනා ඇති 22 ක් පමණ වූ ගවගාල් හි ඇති කරන 2000 ක් පමණ වූ ගවයින්ගෙන් වැව් ඉවුරු වලට සහ ඇළ මාර්ග වලට බරපතල හානි සිදුවීම මෙන්ම මැණික්, වැලි සහ පස් සඳහා වාණිජ මට්ටමෙන් සිදු කෙරෙන පතල් කැණීම් හේතුවෙන් එල්ලංගාව දැඩි පාංශු ඛාදනයට ලක්වෙමින් පැවතීම. | පාංශු ඛාදනය |
| 4 | අවිධිමත් හේන් වගාව සහ පතල් කැණීමෙන් ඉවතලන පස්, ගව අපද්‍රව්‍ය ජලය සමඟ මිශ්‍රව වැව් පද්ධතියට එකතු වීම තුල වැව් රොන්මඩ වලින් පිරී යෑම සහ වැව් තුල ජලජ ශාඛ සීඝ්‍ර ලෙස බෝවීම. | රොන්මඩ පිරීම |
| 5 | පුරාණ වැව් පද්ධතියේ කට්ටකඩුව, ගස් ගොම්මන, ඉස්වැටිය, තිස්බඹය සහ අපවහන ඇළ මාර්ග විනාශ වීම තුල දැනටමත් එල්ලංගාවේ හෙක්ටයාර 37 ක් ලවණතාවයට බඳුන් වී තිබීම සහ එය තවදුරටත් ව්‍යාප්ත වෙමින් පැවතීම. | ලවණතාවය |
| 6 | හෙක්ටයාර් 1549 කට ආසන්න භූමි ප්‍රදේශයක අනවසර සහ අවිධිමත් සිදු කෙරෙන හේන් වගාව සහ අලුතින් හේන් සඳහා කැලෑ එළිපෙහෙළි කිරීමත්, පලු වාරයට 350 - 400 ක් පමණ කණ්ඩායම් පැමිණ පලු නෙලීම සඳහා සිදු කෙරෙන පලු ගස් වල විශාල අතු කපා හෙළීම තුල සිදුවන සීඝ්‍ර වන විනාශය. | වන විනාශය |
| 7 | පළාත් පාලන ආයතනය සහ 20 ක් පමණ වූ කඳවුරු භූමි (Camp Sites) තුලින් අවිධිමත්ව බැහැර කරන පොලිතීන් ඇතුළු ඝණ අපද්‍රව්‍ය නිසා බැර ලෝහ ද්‍රව්‍ය ජල පෝෂක ප්‍රදේශයට එක්වීම සහ එමගින් දැවැන්ත පරිසර දූෂණයක් සිදු වීම මෙන්ම කසල පරිභෝජනය නිසා වන සතුන් රෝගාතුර වීම. | පරිසර දූෂණය |
| 8 | නෛතිකව බලය සහ වගකීම පවරා ඇති පවතින ආයතනික ව්‍යුහයේ අකාර්යක්ෂමතාවය නිසා එල්ලංගාව සහ එහි වැව් පද්ධතිය තුල ක්‍රමවත් ජල කළමණාකරන වැඩ පිළිවෙලක් නොමැති වීම සහ වාරි පද්ධතිය නිසි ලෙස නඩත්තු කිරීමක් සිදු නොකිරීම. | දුර්වල ජල කළමණාකරනය සහ නඩත්තුව |
| 9 | එල්ලංගාව තුල ප්‍රමාණවත් ලෙස ආහාර සහ ජලය නොතිබීමත්, අනවසර අලි වැටවල් විශාල ප්‍රමාණයක් අවිධිමත්ව එල්ලංගාව තුල ඉදිකර තිබීමත්, සහ නොයෙක් මිනිස් ක්‍රියාකාරකම් නිසා නිදහස් චරණයට බාධා ඇති වීමත් නිසා වන සතුන් ගම් වැදීම සහ විශේෂයෙන්ම අලි මිනිස් ගැටුම උග්‍ර වෙමින් පැවතීම. | අලි මිනිස් ගැටුම |
| 10 | ප්‍රතිපත්ති සම්පාදකයින්, පාර්ශවකාර සංවිධාන සහ ප්‍රතිලාභී ප්‍රජාව තුල එල්ලංගාව සුරැකීම සහ එහි තිරසරභාවය පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම නිසාවෙන් එයට අවම ප්‍රමුඛතාවයක් ලැබී තිබීම. | දැනුවත් භාවයේ මඳකම |

## 4.2. එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ පරමාර්ථ සහ අරමුණු

### 4.2.1. පරමාර්ථය

බැබව සරුසාර සහ තිරසාර එල්ලංගා පද්ධතියක් බවට පත් කිරීම සඳහා සියළු පාර්ශවකරුවන් විධිමත් සැලැස්මක් ඔස්සේ සඵලදායීව සහ සාමූහිකව ක්‍රියා කරති.

### 4.2.2. අරමුණු (මේවා උග්‍ර ගැටළු විසඳීම හා පරමාර්ථ සාදනය සඳහා යොදාගනු ලබන උපාය මාර්ගික මැදිහත්වීම් වල අරමුණු ලෙස සැලකේ)

i. ගොවි ජල හිඟය අවම කිරීම සහ දේශගුණ සුහුරු කෘෂි භාවිතයන්ට ගොවි ජනතාව යොමු කරවීමට දායක වීම.
ii. ජලධාරා ප්‍රදේශයට සහ ස්වාභාවික ජලමාර්ග වලට වන අවහිරය වලකාලීමට දායක වීම.
iii. වැව් සහ ඇළවේලි පද්ධතිය ගව හානි වලින් ආරක්ෂා කිරීමට දායක වීම.
iv. පාංශු ඛාදනය සහ වැව් තුල රොන්මඩ තැන්පත් වීම අවම කිරීමට දායක වීම.
v. එල්ලංගා භූමි ප්‍රදේශය ලවණතාවයට පත්වීමේ අවදානම අවම කිරීමට දායක වීම
vi. ජල පෝෂක හා ජලධාරා ප්‍රදේශ වල සිදුවන වන විනාශය නවතාලීමට දායක වීම.
vii. කසල කළමණාකරන ක්‍රම හඳුන්වාදීම සහ එල්ලංගාව තුල සිදුවන පරිසර දූෂණය අවම කිරීමට දායක වීම.
viii. එල්ලංගාව සහ වැව් පද්ධතියේ ජල කළමණාකරනය සඳහා පවතින ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම.
ix. අලි මිනිස් ගැටුම අවම කිරීමට දායක වීම.
x. දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් එල්ලංගාව සුරැකීම සඳහා පාර්ශවකරුවන් සහ ප්‍රතිලාභීන් සජීවීකරණය කිරීම.

## 4.3 එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

උග්‍ර ගැටළු යනු ප්‍රතිපත්ති සම්පාදකයන්, එල්ලංගා කළමණාකරන කමිටුව, පාර්ශවකාර ආයතන කඩිනමින් අවධානය යොමු කර මැදිහත් වීම් සිදුකර විසඳාගත යුතු හෝ අවම කර ගත යුතු ගැටළු වේ. උපායමාර්ගික මැදිහත් වීම් ක්‍රියාත්මක කිරීම හරහා උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම කල හැක. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය හා ප්‍රජා මූල සංවිධාන සහයෝගයෙන් ශිල්පීය මැදිහත් විම් ඇතුලත් වඩාත් සුදුසු ක්‍රියාකාරකම් හරහා තාත්විකව සංවර්ධන කල ක්‍රියාත්මක සැලැස්මක් හරහා උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම කල හැක. ඒවා පහත වගු අංක12 හි දක්වා ඇත.

වගු අංක12 - අරමුණු සාධනය සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

| අනු අංක | අරමුණ | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| 1 | ගොවි ජල හිඟය අවම කිරීම සහ දේශගුණ සුහුරු වාරි කෘෂි භාවිතයන්ට ගොවි ජනතාව යොමු කරවීමට දායක වීම. | 1.1 ලුණුගම්වෙහෙර රන්මිනිතැන්නේ සිට කි.මී.4 ක් පමණ දිග ඇල මාර්ගයක් ඉදිකර කරපිඩංග වැවට, ජුල්පතාන වැවට සහ මුවන් වැවට ජලය ලබාදීම, වෙහෙරගල ජලාශයේ සිට කොච්චිපතාන වැවට ජලය ලබාදෙන ඇල දෙයියන්ගේ කන්ද දක්වා කි.මී.6 ක් පමණ දීර්ඝ කර බැන්දූ වැවට ජලය ලබාදීම, වෙහෙරගල සිට ලුණුගම්වෙහෙර ජලාශයට ජලය ලබාදෙන ඇල මාර්ගය පුළුල් කිරීම. |
| | | 1.2 කුඹුරු වල පවත්නා පතහ 10 ක් (තඹරව 5, කිරිකරමැටිය 2, රොටවැව 2, ජුල්පතාන 1) පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. |
| | | 1.3 දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි සංවිධාන හරහා හඳුන්වා දීම හා යල කන්නයේ කුඹුරුවල අතිරේක බෝග වගාව ව්‍යාප්ත කිරීම. |
| | | 1.4 එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය නියාමනය කිරීම. |
| | | 1.5 ලැබෙන ජලය එල්ලංගාවේ සියලුම ජල ජල පාර්භෝගිකයින් අතර බෙදා දීමේ අවශ්‍යතාවය පිලිබඳව දැනුවත් කිරීම. |
| | | 1.6 ගොවි නිෂ්පාදන සඳහා ඉහල මිලක් සපයා ගැනීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ ගනුදෙනු කිරීමට නිෂ්පාදන සමිති හා නිෂ්පාදන සංගම් ශක්තිමත් කිරීම, පසු අස්වනු තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම, වගාකරුවන් හා මිලදීගන්නන් අතර සබඳතාවය ගොඩනැගීම හා පසු විපරම. |
| 2 | ජලධාරා ප්‍රදේශයට සහ ස්වාභාවික ජලමාර්ග වලට වන අවහිරය වලකාලීමට දායක වීම. | 2.1 දැනට ඉදිකොට ඇති පෞද්ගලික වැව් සහ ජල මාර්ග අවහිර කිරීම පිලිබඳව සමීක්ෂණයක් පවත්වා පවත්නා වැව් හඳුනා ගැනීම සහ මින් ඉදිරියට එල්ලංගාව තුල පෞද්ගලික වැව් ඉදිකිරීම නතර කිරීම සඳහා නීතිමය පියවර ගැනීම. |
| | | 2.2 දැනට පෞද්ගලික වැව් ඉදිකර ඇති ගොවීන්ට ආසන්න ගොවි සංවිධාන වල සාමාජිකත්වය ලබාදී ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු නියාමනය කිරීම. |

| | | |
|---|---|---|
| 3 | වැව් සහ ඇළවේලි පද්ධතිය ගව හානි වලින් ආරක්ෂා කිරීමට දායක වීම. | 3.1 එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. |
| | | 3.2 නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගව හිමියන් යොමු කිරීම. |
| 4 | පාංශු ඛාදනය සහ වැව් තුල රොන්මඩ තැන්පත් වීම අවම කිරීමට දායක වීම. | 4.1 එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වලසිදු කරනු ලබන හේන් වගාවේදී පස් සෝදා යාම වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. |
| | | 4.2 එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. |
| | | 4.3 වැව් තුල ඇති ගවගාල් වලින් වැවට වන හානිය පිලිබඳව ගව හිමියන් දැනුවත් කර ඒවා කඩිනමින් ඉවත් කිරීම. |
| | | 4.4 ප්‍රතිලාභීන්ගේද සහාය ඇතිව එල්ලංගාව තුල අනවසර පතල් කැපීම, පස් කැපීම සහ වැලි ගොඩ දැමීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම. |
| 5 | එල්ලංගා භූමි ප්‍රදේශය ලවණතාවයට පත්වීමේ අවදානම අවම කිරීමට දායක වීම**.** | 5.1 බැබව, ජුල්පතාන, තඹරව, රොටවල, මයිලැත්ත, අලිවල, මුවන් වැව, බැන්දු වැව යන වැව් වල ලවණතාවයට ගොදුරු වී ඇති කුඹුරු ඉඩම් වල කිවුල් ඇල වල් කි.මී.6 ක් පමණ ඉදිකිරීම. |
| | | 5.2 පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඹය, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම, අපවහන ඇල වල් මනාව නඩත්තු කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. |
| | | 5.3 ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග භාවිතය ප්‍රචලිත කිරීම හා කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. |
| 6 | ජල පෝෂක හා ජලධාරා ප්‍රදේශ වල සිදුවන වන විනාශය නවතාලීමට දායක වීම. | 6.1 අලුතින් හේන් වගා කිරීම සඳහා කැලෑ කැපීම සම්පූර්ණයෙන්ම නැවත්වීම සඳහා කටයුතු කිරීම. |
| | | 6.2 පලු ගෙඩි කැඩීම සඳහා දිනකට ඇතුල්වන 400 ක් පමණ කණ්ඩායම් පලු ගස් වල විශාල අතු බිම හෙලා ගෙඩි කැඩීමෙන් වනාන්තරයට වන හානිය පිළිබඳව දැනුවත් කිරීම**,** ආරක්ෂිත ලෙස පලු ගෙඩි කැඩීම සඳහා ක්‍රම හඳුන්වා දීම හා පලු ගස්වල විශාල අතු කඩා ගෙඩි කඩන අයට එරෙහිව නිත්‍යානුකූලව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| 7 | කසල කළමණාකරන ක්‍රම හඳුන්වාදීම සහ එල්ලංගාව තුල සිදුවන පරිසර දූෂණය අවම කිරීමට දායක වීම. | 7.1 දැනට එල්ලංගාව තුළ පිහිටි කසළ අංගනයේ ඇති අපද්‍රව්‍ය පරිසරයට එකතු වීම වැලක්විම සඳහා මතු පිටින් පස් යොදා කසල අංගනයේ ඇති කසල වසා දැමීම සඳහා කටයුතු කිරීම. |
| | | 7.2 කසල අංගනයේ පැල සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. |
| | | 7.3 එල්ලංගාවට කසළ බැහැර කරන සියලු දෙනා එහි ආදිනව පිළිබද දැනුවත් කිරීම. |
| **8** | එල්ලංගාව සහ වැව් පද්ධතියේ ජල කළමණාකරනය සඳහා පවතින ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම. | 8.1 එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන 10 ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 05 ක් පැවැත්වීම හා ගොවි සංවිධාන වල කාන්තා සහභාගීත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කිරීම. |
| | | 8.2 උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හඳුන්වා දීම හා ව්‍යප්ත කිරීම. |
| | | 8.3 ජලය මැනීම සඳහා ජල මාපක සවි කිරිම, ඒ අනුව ජල භාවිතය පිලිබඳ තොරතුරු එකතු කිරීම, ඒවා සමාජ ගත කිරීම, එම තොරතුරු මත ජලය බෙදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. |
| | | 8.4 ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීමට සෑම ගොවි සංවිධානයක් සඳහාම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. |
| | | 8.5 එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව්, ඒවායේ ඇළ මාර්ග, නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරිම සඳහා වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුලු අදාල පාර්ශව යොමු කරවීම. |
| | | 8.6 එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග **(Standard Operation Procedure – SOP)** සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. |
| | | 8.7 සෑම වගා කන්නයකදීම එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික තීරණ ගැනීම. |
| | | 8.8 එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග වන තඹරව සිට බැන්දූ වැව පාර (කි.මී.5), මයිලැත්ත පාර (කි.මී.1), රොටවැව සිට මුවන් වැව පාර |

| | | |
|---|---|---|
| | | (කි.මී.2), කරුවලවංගුව වැව පාර (කි.මී.1), අලිවල වැව පාර (කි.මී.1) බොරළු යොදා අලුත්වැඩියා කිරීම. |
| 9 | අලි මිනිස් ගැටුම අවම කිරීමට දායක වීම. | 9.1 දැනට එල්ලංගාව තුල පිහිටි අලිවැට ප්‍රතිසංස්කරණය කිරීම හා නිරන්තරයෙන්ම අලි වැට කඩා අලින් එල්ලංගාවට ඇතුලු වන ප්‍රදේශ ආවරණය වන පරිදි පවතින අලිවැටට සමාන්තරව කි.මී 5 ක් දිග අගලක් කැපීම. |
| | | 9.2 වනජීවි කලාපය තුළ අලින් ඇතුලු වන සතුන්ට ජල සුලභතාවය ඇති කිරීම සඳහා පනාගම්මන සහ දෙයියන්ගේ වැව අලුත්වැඩියා කිරීම. |
| | | 9.3 අනාරක්ෂිත සහ අවිධිමත් විදුලි වැටවල් ඉවත් කිරීම සඳහා ගොවීන් දැන්වත් කිරීම. |
| 10 | පාර්ශවකරුවන් සහ ප්‍රතිලාභීන් එල්ලංගාව සුරැකීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් සජීවීකරණය කිරීම. | 10.1 එල්ලංගාව සුරකීම පිළිබඳව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් විදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් හා බලි තොවිල් මගින් දැනුවත් කිරීම. |

# 5. එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම

එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුවට එල්ලංගාව සහ ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මගපෙන්වයි. සහභාගීත්ව ක්‍රමවේද යටතේ සියලු හවුල්කාර ආයතනවල මැදිහත් වීමෙන් එල්ලංගා පැතිකඩෙන් හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සංවර්ධනය කර ඇත. හඳුනාගත් මැදිහත් වීම්, කාලවකවානු, යෝජිත මැදිහත්වීම්, ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන ඇතුලත් Gannt සටහනින් ඉහත කාර්යය පහසු වී ඇත. වගු අංක 13 හි මෙම සටහනට අනුපූර්වකයක් ලෙස එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මේ ඇතුලත් සෑම මැදිහත්වීමක් සඳහාම වැය වන දල වියදම සහ හවුල්කාර ආයතන, පෞද්ගලික අංශය සහ ප්‍රජා මූල සංවිධාන වලින් අපේක්ෂිත දායකත්වය හා ආධාර ලබාදෙන ආයතන වලින් අපේක්ෂිත මූල්‍ය දායකත්වය දක්වා ඇත. එසේම වගු අංක 14 හි දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මැදිහත් වීම් වල දල වියදම හා ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු දක්වා ඇත.

වගු අංක 13 - එල්ලංගා පද්ධති කළමණාකරනය සඳහා ක්‍රියාතකාරකම්, කාලරාමුව සහ වගකීම් සැලැස්ම (Gannt සටහන )

| අංක | උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීමේ ප්‍රධාන ක්‍රියාකාරකම් | දළ පිරිවැය (රු.මි) | කාලරාමුව | | | | | | | | | | | | ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කෙටිකාලීන ඔක්තෝබර් - දෙසැම්බර් 2023 | | | | මධ්‍යකාලීන ජන - දෙසැ 2024 | | | | දිගුකාලීන ජන - දෙසැ 2025 | | | | | |
| | | | සැප් | ඔක් | නොවැ | දෙසැ | ත්‍රෛ 1 | ත්‍රෛ 2 | ත්‍රෛ 3 | ත්‍රෛ 4 | ත්‍රෛ1 | ත්‍රෛ 2 | ත්‍රෛ 3 | ත්‍රෛ 4 | ප්‍රධාන | අනෙකුත් |
| 1 | I. ලුණුගම්වෙහෙර රන්මිනිතැන්නේ සිට කි.මී.4 දිග ඇල මාර්ගයක් ඉදිකර කරපිඩංග වැවට, පුල්පතාන වැවට සහ මුවන් වැවට ජලය ලබාදීම, වෙහෙරගල ජලාශයේ සිට කොච්චිපතාන වැවට ජලය ලබාදෙන ඇල දෙයියන්ගේ කන්ද දක්වා කි.මී.6 ක් දීර්ඝ කර බැන්දු වැවට ජලය ලබාදීම සහ වෙහෙරගල සිට ලුණුගම්වෙහෙර ජලාශයට ජලය ලබාදෙන ඇල මාර්ග පුළුල් කිරීම. | 500 | | | | | | | | | | | | | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | II. කුඹුරු වල පවත්නා පතහ 10 ක් (තඹරව 5, කිරිකරමැටිය 2, රොටවැව 2, පුල්පතාන 1) පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. | 1.00 | | | | | | | | | | | | | **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව** | **වන සංරක්ෂණ දෙපාර්තමේන්තු, ගොවි සංවිධාන** |
| | III. දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි සංවිධාන හරහා හඳුන්වා දීම. | 0.50 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | **ගොවි සංවිධාන** |
| | IV. එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය පසුවිපරම් කිරීම. | 0.20 | | | | | | | | | | | | | **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | **ගොවි සංවිධාන** |
| | V. ලැබෙන ජලය එල්ලංගාවේ සියලුම ජල පාර්භෝගිකයින් අතර බෙදා දීමේ අවශ්‍යතාවය පිලිබඳව දැනුවත් කිරීම. | 0.05 | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | VI. ගොවි නිෂ්පාදන සඳහා ඉහල මිලක් සපයා ගැනීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ ගනුදෙනු කිරීමට නිෂ්පාදන සමිති හා නිෂ්පාදන සංගම් ශක්තිමත් කිරීම. | 0.5 | | | | | | | | | | | | | **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | **ගොවි සංවිධාන** |
| 2 | I. දැනට ඉදිකොට ඇති පෞද්ගලික වැව් සහ ජල මාර්ග අවහිර කිරීම පිලිබඳව සමීක්ෂණයක් පවත්වා පවත්නා වැව් හඳුනා ගැනීම සහ මින් ඉදිරියට එල්ලංගාව තුල පෞද්ගලික වැව් ඉදිකිරීම තහනම් කිරීම සඳහා නීතිමය පියවර ගැනීම. | 0.05 | | | | | | | | | | | | | **වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **ගොවි සංවිධාන** |
| | II. දැනට පෞද්ගලික වැව් ඉදිකර ඇති ගොවීන්ට ආසන්න ගොවි සංවිධාන වල සාමාජිකත්වය ලබාදී ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු නියාමනය කිරීම. | 0.05 | | | | | | | | | | | | | **ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව** | ගොවි සංවිධාන |
| 3 | I. එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. | 0.20 | | | | | | | | | | | | | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | II. නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගව හිමියන් යොමු කිරීම. | 10.00 | | | | | | | | | | | | | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, | ගොවි සංවිධාන |
| 4 | I. එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වලසිදු කරනු ලබන හේන් වගා බිම් වලින් පස් සෝදා යාම වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | 5.00 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගොවි සංවිධාන |
| | II. එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. | 8.00 | | | | | | | | | | | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | III. වැව් තුල ඇති ගවගාල් වලින් වැවට වන හානිය පිලිබඳව ගව හිමියන් දැනුවත් කර ඒවා කඩිනමින් ඉවත් කිරීම. | 0.05 | | | | | | | | | | | | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පරිසර පොලිසිය | ගොවි සංවිධාන |
| | IV. ප්‍රතිලාභීන්ගේද සහාය ඇතිව එල්ලංගාව තුල අනවසර පතල් කැපීම, පස් කැපීම | 0.10 | | | | | | | | | | | | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පරිසර පොලිසිය, | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සහ වැලි ගොඩ දැමීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම. | | | | | | | | | | | | | | භූ විද්‍යා හා පතල් කැණීමේ කාර්යාංශය | |
| 5 | I. බැබව, ජුල්පතාන, තඹරව, රොටවල, මයිලැත්ත, අලිවල,මු වන් වැව, බැන්දූ වැව යන වැව් වල ලවණතාවයට ගොදුරු වී ඇති කුඹුරු ඉඩම් වල කිවුල් ඇල වල් කි.මී.6 ක් පමණ ඉදිකිරීම. | 3.00 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගොවි සංවිධාන |
| | II. පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඹය, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම, අපවහන ඇල වල් මනාව නඩත්තු කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | 10.00 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | III. ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග හා කෘෂිකාර්මික වත් පිලිවෙත් භාවිතය ප්‍රචලිත කිරීම හා කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | 0.50 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 6 | I. අලුතින් හේන් වගාව සඳහා රක්ෂිත කැලෑ කැපීම | 0.10 | | | | | | | | | | | | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සම්පූර්ණයෙන්ම නැවත්වීම සඳහා කටයුතු කිරීම. | | | | | | | | | | | | | | | |
| | II. පලු ගෙඩි කැඩීම සඳහා දිනකට ඇතුල්වන **350 - 400** පමණ කණ්ඩායම් පලු ගස් වල විශාල අතු බිම හෙලා ගෙඩි කැඩීමෙන් වනාන්තරයට වන හානිය පිළිබඳව දැනුවත් කිරීම, ආරක්ෂිත ලෙස පලු ගෙඩි කැඩීම සඳහා ක්‍රම හඳුන්වා දීම හා පලු ගස්වල විශාල අතු කඩා ගෙඩි කඩන අයට එරෙහිව නිත්‍යානුකූලව කටයුතු කිරීම. | 0.30 | | | | | | | | | | | | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගොවි සංවිධාන |
| 7 | I. දැනට එල්ලංගාව තුල පිහිටි කසළ අංගනයේ අපද්‍රව්‍ය පරිසරයට එකතු වීම වැලක්විම සඳහා මතු පිටින් පස් යොදා කසල අංගනයේ ඇති කසල වසා දැමීම සඳහා කටයුතු කිරීම. | 5.00 | | | | | | | | | | | | | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ගොවි සංවිධාන |
| | II. කසල අංගනයේ පැල සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 1.00 | | | | | | | | | | | | | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු, ගොවි සංවිධාන |
| | III. එල්ලංගාවට කසළ බැහැර කරන සියලු දෙනා එහි ආදීනව පිළිබඳ දැනුවත් කිරීම. | 0.20 | | | | | | | | | | | | | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |
| 8 | I. එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන 10 ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 05 ක් පැවැත්වීම හා ගොවි සංවිධාන වලට කාන්තා සහභාගීත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කිරීම. | 0.30 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | II. උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හඳුන්වා දීම හා ව්‍යාප්ත කිරීම. | 0.50 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | III. ජලය මැනීම සඳහා ජල මාපක සවි කිරිම, ඒ අනුව ජල භාවිතය පිලිබඳ තොරතුරු එකතු කිරීම, එම තොරතුරු මත ජලය බෙදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. | 0.20 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | IV. ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීම සඳහා සෑම ගොවි සංවිධානයකටම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. | 3.00 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | V. එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව්, ඒවායේ ඇළ මාර්ග, නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරීම සඳහා වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුලු අදාල පාර්ශව යොමු කරවීම. | 0.05 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | VI. එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග **(Standard Operation Procedure – SOP)** සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. | 0.05 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | VII. සෑම වගා කන්නයකදීම එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික තීරණ ගැනීම. | 0.05 | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | VIII. එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග වන තඹරව සිට බැන්දු වැව පාර (කි.මී.5), මයිලැත්ත පාර (කි.මී.1), රොටවැව සිට මුවන් වැව පාර (කි.මී.2), කරුවලවංගුව වැව පාර (කි.මී.1), අලිවල වැව පාර (කි.මී.1) බොරළු යොදා අලුත්වැඩියා කිරීම. | 12 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 9 | I. පවතින අලිවැට ප්‍රතිසංස්කරණය කිරීම හා දැනට පවතින අලිවැටට සමාන්තරව කි.මී 5 ක් දිග අගලක් කැපීම. | 10.00 | | | | | | | | | | | | | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| | II. වනජීවී කලාපය තුළ අලින් ඇතුලු වන සතුන්ට ජල සුලභතාවය ඇති කිරීම සඳහා පනාගම්මන සහ දෙයියන්ගේ වැව අලුත්වැඩියා කිරීම. | 7.50 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | III. අනාරක්ෂිත සහ අවිධිමත් විදුලි වැටවල් ඉවත් කිරීම සඳහා ගොවීන් දැන්වත් කිරීම | 0.10 | | | | | | | | | | | | | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 10 | I. එල්ලාංගාව සුරකීම පිළිබඳව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් විදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් හා බලි තොවිල් මගින් දැනුවත් කිරීම. | 2.00 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | එකතුව | 581.55 | | | | | | | | | | | | | | |

## 5.2. යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්, වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දල මූල්‍ය දායකත්වය

යෝජිත මැදිහත්වීම් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දායකත්වය පහත වගු අංක 14 යේ දැක්වේ.

වගු අංක 14 - ඇස්තමේන්තුගත වියදම

| අංක | යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් | ආසන්න වියදම (රු. වලින් ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | මුලු දල වියදම (රු.මි) | පෞද්ගලික අංශයේ දායකත්වය (රු.මි) | පාර්ශවකාර ආයතන වල දායකත්වය (රු.මි) | ප්‍රජා දායකත්වය (රු.මි) | ආධාර සපයන ආයතන වලින් අපේක්ෂිත මුදල (රු.මි) |
| 1 | ලුණුගම්වෙහෙර රන්මිනිතැන්නේ සිට කි.මී.4 දිග ඇල මාර්ගයක් ඉදිකර කරපිඩංග වැවට, ජූල්පතාන වැවට සහ මුවන් වැවට ජලය ලබාදීම, වෙහෙරගල ජලාශයේ සිට කොච්චිපතාන වැවට ජලය ලබාදෙන ඇල දෙයියන්ගේ කන්ද දක්වා කි.මී.6 ක් දීර්ඝ කර බැන්දු වැවට ජලය ලබාදීම සහ වෙහෙරගල සිට ලුණුගම්වෙහෙර ජලාශයට ජලය ලබාදෙන ඇල මාර්ග පුළුල් කිරීම. | 500 | 20 | 75 | 5 | 400 |
| 2 | කුඹුරු වල පවත්නා පතහ 10 ක් (තඹරව 5, කිරිකරමැටිය 2, රොටවැව 2, ජූල්පතාන 1) පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. | 1.0 | | 0.8 | 0.2 | |
| 3 | දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි සංවිධාන හරහා හඳුන්වා දීම හා යල කන්නයේ කුඹුරු වල අතිරේක බෝග වගාව ව්‍යාප්ත කිරීම. | 0.5 | | 0.5 | | |
| 4 | එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය නියාමනය කිරීම. | 0.2 | | 0.5 | | |
| 5 | ලැබෙන ජලය එල්ලංගාවේ සියලුම ජල පාර්භෝගිකයින් අතර බෙදා දීමේ අවශ්‍යතාවය පිලිබඳව දැනුවත් කිරීම. | 0.05 | | 0.05 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | ගොවි නිෂ්පාදන සඳහා ඉහල මිලක් සපයා ගැනීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ ගනුදෙනු කිරීමට නිෂ්පාදන සමිති හා නිෂ්පාදන සංගම් ශක්තිමත් කිරීම, පසු අස්වනු තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම, වගාකරුවන් හා මිලදීගන්නන් අතර සබඳතාවය ගොඩනැගීම හා පසු විපරම. | 0.5 | | 0.5 | | |
| 7 | දැනට ඉදිකොට ඇති පෞද්ගලික වැව් සහ ජල මාර්ග අවහිර කිරීම පිලිබඳව සමීක්ෂණයක් පවත්වා මින් ඉදිරියට පෞද්ගලික වැව් ඉදිකිරීම තහනම් කිරීම සඳහා නීතිමය පියවර ගැනීම. | 0.05 | | 0.05 | | |
| 8 | දැනට පෞද්ගලික වැව් ඉදිකර ඇති ගොවීන්ට ආසන්න ගොවි සංවිධාන වල සාමාජිකත්වය ලබාදී ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු නියාමනය කිරීම. | 0.05 | | 0.05 | | |
| 9 | එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. | 0.2 | | 0.2 | | |
| 10 | නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගොවීන් යොමු කිරීම. | 10.0 | 1.0 | 7.5 | 1.5 | |
| 11 | එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වලසිදු කරනු ලබන හේන් වගාවේදී පස් සෝදා යාම වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | 5.0 | | 5.0 | | |
| 12 | එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. | 8.0 | 2.0 | 6.0 | | |
| 13 | වැව් තුල ඇති ගවගාල් වලින් වැවට වන හානිය පිලිබඳව ගව හිමියන් දැනුවත් කර කඩිනමින් ඉවත් කිරීම. | 0.05 | | 0.05 | | |
| 14 | ප්‍රතිලාභීන්ගේද සහාය ඇතිව එල්ලංගාව තුල අනවසර පතල් කැපීම/පස් කැපීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම. | 0.1 | | 0.1 | | |
| 15 | බැබව, ජූල්පතාන, තඹරව, රොටවල, මයිලැත්ත, අලිවල, මුවන් වැව, බැන්දු වැව යන වැව් වල ලවණතාවයට ගොදුරු වී ඇති කුඹුරු ඉඩම් වල කිවුල් ඇල වල් කි.මී. 6 ක් පමණ ඉදිකිරීම. | 3.0 | | 3.0 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 16 | පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඹය, අපවහන ඇලවල්, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | 10 | | 9.0 | 1.0 | |
| 17 | ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග භාවිතය ප්‍රචලිත කිරීම හා කෘෂිකාර්මික වත් පිළිවෙත් ප්‍රචලිත කිරීම. | 0.5 | | 0.5 | | |
| 18 | අලුතින් හේන් වගා කිරීම සඳහා කැලෑ කැපීම සම්පූර්ණයෙන්ම නැවත්වීම සඳහා කටයුතු කිරීම. | 0.1 | | 0.1 | | |
| 19 | පලු ගෙඩි කැඩීම සඳහා දිනකට ඇතුල්වන 400 පමණ කණ්ඩායම් පලු ගස් වල විශාල අතු බිම හෙලා ගෙඩි කැඩීමෙන් වනාන්තරයට වන හානිය පිළිබඳව දැනුවත් කිරීම, ආරක්ෂිත ලෙස පලු ගෙඩි කැඩීම සඳහා ක්‍රම හඳුන්වා දීම හා පලු ගස්වල විශාල අතු කඩා ගෙඩි කඩන අයට එරෙහිව නිත්‍යානුකූලව කටයුතු කිරීම. | 0.3 | | 0.3 | | |
| 20 | දැනට එල්ලංගාව තුළ පිහිටි කසළ අංගනයේ ඇති අපද්‍රව්‍ය පරිසරයට එකතු වීම වැලක්වීම සඳහා මතු පිටින් පස් යොදා කසල අංගනයේ ඇති කසල වසා දැමීම සඳහා කටයුතු කිරීම. | 5.0 | 2.0 | 3.0 | | |
| 21 | කසල අංගනයේ පැල සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 1.0 | 0.5 | 0.5 | | |
| 22 | එල්ලංගාවට කසළ බැහැර කරන සියලු දෙනා එහි ආදීනව පිළිබඳ දැනුවත් කිරීම. | 0.2 | | 0.2 | | |
| 23 | එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන 10 ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 05 ක් පැවැත්වීම හා ගොවි සංවිධාන වල කාන්තා සහභාගීත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කිරීම. | 0.3 | | 0.3 | | |
| 24 | උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හඳුන්වා දීම හා ව්‍යාප්ත කිරීම. | 0.5 | | 0.5 | | |
| 25 | ජලය මැනීම සඳහා ජල මාපක සවි කිරිම, ඒ අනුව ජල භාවිතය පිළිබඳ තොරතුරු එකතු කිරීම, ඒවා සමාජගත කිරීම, එම තොරතුරු මත ජලය බෙදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. | 0.2 | | 0.2 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26 | ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීමට සෑම ගොවි සංවිධානයක් සඳහාම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. | 3.0 | | 3.0 | | |
| 27 | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව්, ඒවායේ ඇළ මාර්ග, නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරීම සඳහා වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුලු අදාල පාර්ශව යොමු කරවීම. | 0.05 | | 0.05 | | |
| ළ | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග (Standard Operation Procedure – SOP) සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. | 0.05 | | 0.05 | | |
| 29 | සෑම වගා කන්නයකදීම එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික තීරණ ගැනීම. | 0.05 | | 0.05 | | |
| 30 | එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග වන තඹරව සිට බැන්දු වැව පාර (කි.මී.5), මයිලැත්ත පාර (කි.මී.1), රොටවැව සිට මුවන් වැව පාර (කි.මී.2), කරුවලවංගුව වැව පාර (කි.මී.1), අලිවල වැව පාර (කි.මී.1) බොරළු යොදා අලුත්වැඩියා කිරීම. | 12 | | 10 | 2 | |
| 31 | දැනට එල්ලංගාව තුල පිහිටි අලි වැට ප්‍රතිසංස්කරණය කිරීම හා නිරන්තරයෙන්ම අලි වැට කඩා අලීන් එල්ලංගාවට ඇතුලු වන ප්‍රදේශ ආවරණය වන පරිදි පවතින අලි වැටට සමාන්තරව කි.මී.5ක් දිග අගලක් කැපීම | 10.0 | 2.0 | 6.0 | 2.0 | |
| 32 | වනජීවි කලාපය තුළ අලින් ඇතුලු වන සතුන්ට ජල සුලභතාවය ඇති කිරීම සඳහා පනාගම්මන සහ දෙයියන්ගේ වැව අලුත්වැඩියා කිරිම | 7.5 | | 7.5 | | |
| 33 | අනාරක්ෂිත සහ අවිධිමත් විදුලි වැටවල් ඉවත් කිරීම සඳහා ගොවීන් දැනුවත් කිරීම | 0.1 | | 0.1 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 34 | එල්ලංගාව සුරකීම පිළිබඳව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් වීදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් හා බලි තොවිල් මගින් දැනුවත් කිරීම. | 2.0 | | 2.0 | | |
| | **එකතුව** | **581.55** | **27.5** | **142.35** | **11.7** | **400** |

## 5.3. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම්

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය එහි ව්‍යාපෘති කාලය තුල බැබව එල්ලංගා කළමණාකරන සැලැස්මේ ඇතුලත් උපාය මාර්ගික මැදිහත්වීම් වලට මූල්‍ය අනුග්‍රහය ලබාදීමට අදහස් කර ඇත. තවද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යය මණ්ඩලය හරහා හඳුනාගත් මැදිහත්වීම් සඳහා උප ව්‍යාපෘති වාර්ථා සකස් කිරීමටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහාය ලබාදෙනු ඇත. එසේම යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පාර්ශවකාර ආයතන එල්ලංගා කළමණාකරන කමිටුව සමඟ සබඳතාවයකින් යුක්තව කටයුතු කල යුතුවේ. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් තෝරාගත් මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ දල වියදම් ඇස්තමේන්තුව සහ කාලරාමුව පහත වගු අංක 15 හි දැක්වේ.

වගු අංක 15 - උපායමාර්ගික මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවා ක්‍රියාත්මක කාල රාමුව

| අනු අංක | යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් | ආසන්න වියදම් (රු.) | 2023 | | | | 2024 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සැප් | ඔක් | නොවැ | දෙසැ | ජන | පෙබ | මාර් | අප්‍රේ |
| 1 | කුඹුරු වල පවත්නා පතහ 10 ක් (තඹරව 5, කිරිකරමැටිය 2, රොටවැව 2, ජුල්පතාන 1) පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. | 1.0 | | | | | | | | |
| 2 | දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි සංවිධාන හරහා හඳුන්වා දීමහා යල කන්නයේ කුඹුරු වල අතිරේක බෝග වගාව ව්‍යාප්ත කිරීම. | 0.5 | | | | | | | | |
| 3 | එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය පසුවිපරම් කිරීම. | 0.2 | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | ගොවි නිෂ්පාදන සඳහා ඉහල මිලක් සපයා ගැනීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ ගනුදෙනු කිරීමට නිෂ්පාදන සමිති හා නිෂ්පාදන සංගම් ශක්තිමත් කිරීම. | 0.5 | | | | | | | | | |
| 5 | එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වල සිදු කරනු ලබන හේන් වගාවේදී පස් සෝදා යාම වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | 5.0 | | | | | | | | | |
| 6 | ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග හා කෘෂිකාර්මිකවත් පිලිවෙත් භාවිතය ප්‍රචලිත කිරීම හා කෘෂිකාර්මිකවත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | 3.0 | | | | | | | | | |
| 7 | පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඔය, අපවහන ඇලවල්, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | 9.0 | | | | | | | | | |
| 8 | එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන 10 ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 05 ක් පැවැත්වීම. | 0.3 | | | | | | | | | |
| 9 | උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හදුන්වා දීම හා ව්‍යප්ත කිරීම. | 0.5 | | | | | | | | | |
| 10 | ජල භාවිතය පිලිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ජල මාපක සවි කිරිම සහ ඒ අනුව ජලය යොදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. | 0.2 | | | | | | | | | |
| 11 | ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීමට සෑම ගොවි සංවිධානයක් සඳහාම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. | 3.0 | | | | | | | | | |
| 12 | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව්, ඒවායේ ඇළ මාර්ග, නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරීම සඳහා වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා | 0.05 | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුලු අදාල පාර්ශව යොමු කරවීම. | | | | | | | | | | |
| 13 | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග (**Standard Operation Procedure – SOP)** සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. | 0.05 | | | | | | | | | |
| 14 | සෑම වගා කන්නයකදීම එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික තීරණ ගැනීම. | 0.05 | | | | | | | | | |
| 15 | එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග වන තඹරව සිට බැන්දු වැව පාර (කි.මී.5), මයිලැත්ත පාර (කි.මී.1), රොටවැව සිට මුවන් වැව පාර (කි.මී.2), කරුවලවංගුව වැව පාර (කි.මී.1), අලිවල වැව පාර (කි.මී.1) බොරළු යොදා අලුත්වැඩියා කිරීම. | 10 | | | | | | | | | |
| 16 | වනජීවී කලාපය තුළ අලින් ඇතුලු වන සතුන්ට ජල සුලභතාවය ඇති කිරීම සඳහා පනාගම්මන සහ දෙයියන්ගේ වැව අලුත්වැඩියා කිරිම. | 7.5 | | | | | | | | | |
| 17 | එල්ලාංගාව සුරකීම පිළිබදව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් විදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් හා බලි තොවිල් මගින් දැනුවත් කිරීම. | 2.0 | | | | | | | | | |
| | එකතුව | 42.85 | | | | | | | | | |

## 5.4 එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය

එල්ලංගා කළමණාකරන කමිටුව විසින් එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන අතර එය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එල්ලංගා කළමණාකරන කමිටුව අදාල හවුල්කාර ආයතන වලද සහාය ඇතිව සංකල්ප පත්‍රිකා හෝ උප ව්‍යාපෘති යෝජනා (ඇමුණුම් අංක 04) සකස් කර ඒවා මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා අරමුදල් ලබා දෙන ආයතන වෙත ඉදිරිපත් කල යුතුය. ප්‍රධාන හවුල්කාර ආයතන එනම් හඳුනාගත් මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ආයතන තාක්ෂණික සැලසුම්, අයවැය වාර්ථා සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කර ආධාර ලබාදෙන ආයතන වෙත යෝජනා ඉදිරිපත් කිරීම සඳහා එල්ලංගා කළමණාකරන කමිටුවට සහාය ලබාදිය යුතුවේ. උප ව්‍යාපෘති වාර්තා ක්‍රියාත්මක කිරීමේ තත්වය පිලිබඳ සමාජ විගණනය (Social Auditing) සඳහා ගොවි සංවිධාන වල සහාය ඇතිව ප්‍රතිලාභීන් අතුරින් සමාජ විගණන කමිටු (Social Audit Committees) පත් කර ප්‍රතිලාභීන්ගේද ක්‍රියාකාරී දායකත්වය ලබාගෙන එල්ලංගා කළමණාකරන කමිටුව විසින් ඉටුකරනු ලබන වැඩ වල ගුණාත්මකභාවය ඉහල නංවා ගැනීම සඳහා කටයුතු කල යුතුවේ.

## 5.5 එල්ලංගා කළමණාකරන සැලැස්මේ ක්‍රියාත්මක තත්වය සොයාබැලීම (Monitoring) / පසුවිපරම

එල්ලංගා කළමණාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම එල්ලංගා කළමණාකරන කමිටුවට පැවරේ. ඒ අනුව උප ව්‍යාපෘති වාර්ථා අනුමත කිරීම, ඒ සඳහා අරමුදල් සපයා ගැනීම, ක්‍රියාත්මක තත්වය Monitor කිරීම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සිදු කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව විසින් අනුමත කරනු ලබන සෑම වැඩසටහනක්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම එල්ලංගා කළමණාකරන කමිටුවේ සාමාජිකයන් වන ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත පැවරේ.

එල්ලංගා කළමණාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ තත්වය ඒ සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන විසින් Monitor කල යුතු Monitoring ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන ආයතන හා එම ආයතන විසින් Monitor කල යුතු කාලය පහත වගු අංක 16 හි දැක්වේ.

වගු අංක 16 - එල්ලංගා කළමණාකරන සැලැස්ම Monitor කල යුතු ආයතන සහ Monitor කල යුතු කාලය

| ආයතනය | කාලය |
|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | මාස 6 කට වරක් |
| දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව | මාස 2 කට වරක් |
| ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව | මාසිකව |
| එල්ලංගා කළමණාකරන කමිටුව | මාසිකව |
| ක්‍රියාත්මක කිරීමේ ආයතන | මාසිකව |
| සමාජ විගණන කමිටුව | සතිපතා |

එල්ලංගා කළමණාකරන සැලැස්මේ ඇතුලත් ප්‍රධාන ක්‍රියාකාරකම් Monitor කිරීම සඳහා නිශ්චිත (Specific), මැනිය හැකි (Measurable), ලඟාකර ගත හැකි (Achievable), තාත්වික (Realistic), කාලරාමුවක් (Time Bound) සහිත, කාර්ය සාධන දර්ශක (Key Performance Indicator – KPI) සකස් කල යුතුය. එම කාර්ය සාධන දර්ශක මැනිය හැකි ආකාරයට අවශ්‍ය තොරතුරු ලබා ගෙන අදාල ආයතන විසින් ක්‍රියාත්මක සැලැස්ම Monitor කල යුතුය. මෙම තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර සැකසිය යුතුය. එල්ලංගා කළමණාකරන සැලැස්මේ ක්‍රියාත්මක තත්වය පිළිබඳ තොරතුරු ගලා යන ආකාරය පහත අංක 4 රූපසටහනින් දැක්වේ.

රූපසටහන් අංක 4 - කළමණාකරන තොරතුරු ගලා යන ආකාරය



# 06. ඇමුණුම්

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/3/9/CMC/2023 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023.08.03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.**
**Cascade Management Committee (CMC) Establishment & Continuity**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාර්ග (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ විවිධ ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී පද්ධතිය තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල පරිභෝජනයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, ஸ்ரீ மார்க்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.
ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.
iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රීයව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.
iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.
v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම් කිරීම.
vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.
iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.
v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.
vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.
viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.
x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.
xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මග පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සෑම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## <u>3.4. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවේ සංයුතිය</u>

### 3.4.1 <u>ප්‍රාදේශීය මට්ටම</u>

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. ප්‍රාදේශීය ලේකම්
ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
iii. කෘෂිකර්ම උපදේශක
iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
v. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
vi. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
vii. ග්‍රාම නිලධාරි
viii. සමෘද්ධි සංවර්ධන නිලධාරි
ix. ආර්ථික සංවර්ධන නිලධාරි
x. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
xiii. පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
xiv. පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
xv. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xvi. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
xvii. වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරි
xviii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xx. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xxi. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
xxii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
xxv. ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
xxvi. ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධාරීයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී ව්‍යා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරී හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරී හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන මලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරී හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

***සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

**3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම**

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

**3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම**

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

6

ඇමුණුම් අංක 02 හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය

1. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
7. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව - හම්බන්තොට
8. බැබව ගොවි සංවිධානය
9. මුවන් වැව ගොවි සංවිධානය
10. කරබිඩංග වැව ගොවි සංවිධානය
11. මයිලැත්ත ගොවි සංවිධානය
12. කරුවලවංගුව ගොවි සංවිධානය
13. බැන්දූ වැව ගොවි සංවිධානය
14. තඹරව ගොවි සංවිධානය
15. රොටවල වැව ගොවි සංවිධානය
16. පූල්පතාන ගොවි සංවිධානය
17. හැළඹ වැව ගොවි සංවිධානය
18. අලිවල වැව ගොවි සංවිධානය

ඇමුණුම් අංක 03 එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම සහ එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා සහභාගී වූ ආයතන වල ලේඛණය

1. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
5. දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, හම්බන්තොට
6. බැබව ගොවි සංවිධානය
7. මුවන් වැව ගොවි සංවිධානය
8. කරබිඩංග වැව ගොවි සංවිධානය
9. මයිලැත්ත ගොවි සංවිධානය
10. කරුවලවංගුව ගොවි සංවිධානය
11. බැන්දූ වැව ගොවි සංවිධානය
12. තඹරව ගොවි සංවිධානය
13. රොටවල වැව ගොවි සංවිධානය
14. පූල්පතාන ගොවි සංවිධානය
15. හැළඹ වැව ගොවි සංවිධානය
16. අලිවල වැව ගොවි සංවිධානය

ඇමුණුම් අංක 04: උප ව්‍යාපෘති යෝජනා ආකෘතිය

මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගැනීම සඳහා උප ව්‍යාපෘති යෝජනාවක් (SPPs) සකස් කිරීමේ ආකෘතිය.

1. පරිපාලන විස්තර:

| No | Matters | Details |
|---|---|---|
| 1 | යෝජනා ඉදිරිපත් කරන ආයතනයේ සම්බන්ධතා තොරතුරු: (තැපැල්, විද්‍යුත් තැපැල, දුරකථන ආදිය) | |
| 2 | ක්‍රියාත්මක කිරීමේ ආයතනයේ සම්බන්ධතා තොරතුරු: (තැපැල්, විද්‍යුත් තැපැල, දුරකථන ආදිය) | |
| 3 | යෝජනාව පිළිබඳ තොරතුරු සැපයීම සඳහා වගකිව යුතු පුද්ගලයාගේ තනතුර සමඟ සම්බන්ධතා තොරතුරු (විද්‍යුත් තැපැල, දුරකථනය - ඉඩම්/ජංගම) | |
| 4 | යෝජනාවේ අංශය (වැව් ප්‍රතිසංස්කරණය/ජල පෝෂක පිරිපහදු කිරීම/කෘෂිකාර්මික පිළිවෙත්/අලෙවිකරණය/ආයතනික සංවර්ධනය/තාක්ෂණ | |

| | | |
|---|---|---|
| | හුවමාරුව/පුහුණුව/වෙනත් (නිශ්චය කරන්න ආදිය) | |
| 5 | ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ (DAC) එකඟතාවයේ යොමු අංකය. | |

2. උප ව්‍යාපෘති විස්තර:

2.1. උප ව්‍යාපෘතියේ මාතෘකාව (නම ව්‍යාපෘති සංවර්ධන අරමුණට බෙහෙවින් සමාන විය හැකි නමුත්, සෑම විටම එසේ නොවන බව කරුණාවෙන් සලකන්න):

……………………………………………………………………………………………………

2.2. උප ව්‍යාපෘතියේ සාරාංශය (එය කුමක්ද, එය ඇයි, එය කවුද, එය තිබෙන්නේ කොහේද සහ එය ක්‍රියාත්මක කරන්නේ කවදාද යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන ඉතා කෙටි ඡේදයක් දෙන්න? ඇස්තමේන්තුගත මුළු පිරිවැය ද අවශ්‍ය වේ).

………………………………………………………………………………………………………

2.3. ව්‍යාපෘති ස්ථානය (කඳුවැටිය, ගොවිජන සේවා මධ්‍යස්ථානය, පළාත් පාලන වාට්ටුව, ග්‍රාම නිලධාරී කොට්ඨාශය වැනි විස්තර. ව්‍යාපෘති ස්ථානය ගංවතුරට හෝ නියඟයට බෙහෙවින් ගොදුරු විය හැකි ප්‍රදේශයක් ලෙස සලකන්නේ නම්, කරුණාකර ඒ බව ද දක්වන්න).

………………………………………………………………………………………………………

2.4. ව්‍යාපෘති ගැටළුව/තාර්කික/සාධාරණීකරණය (මෙය ඉතා වැදගත් වන අතර යෝජනාවේ ප්‍රධාන කොටස ලෙස සැලකේ. එබැවින්, කරුණාකර ගැටලුව කුමක්ද, එය ගොවීන්ට බලපාන්නේ කෙසේද, එය හඳුනාගත් ආකාරය සහ එය විසඳා නොගතහොත් සිදුවන අයහපත් බලපෑම් මොනවාද යන්න ඉස්මතු කරන්න).

………………………………………………………………………………………………………

2.5. තීරණාත්මක ගැටළුව හඳුනාගත්තේ කෙසේද? (ප්‍රජා උපදේශන, ගොවි සංවිධානවල ඉල්ලීම්, කඳුරැල්ල කළමනාකරණ සැලැස්ම ආදිය හරහා).

……………………………………………………………………………………………………

2.6. උප ව්‍යාපෘතියේ අරමුණ (අධීක්ෂණ අරමුණ සඳහා එය වැදගත් බැවින් කරුණාකර මෙය ඉතා තාර්කික ආකාරයකින් සකස් කරන්න).

……………………………………………………………………………………………………

2.7. නිශ්චිත අරමුණු (SMART ආකෘතියට අනුව නිශ්චිත අරමුණු සංවර්ධනය කළ යුතු අතර මෙය අධීක්ෂණ අරමුණ සඳහා ද ඉතා වැදගත් වේ)

.

1.

2.

2.8. යෝජිත උප ව්‍යාපෘති ක්‍රියාකාරකම් (මෙම කොටස ඉතා තාර්කිකව විස්තර කළ යුතු අතර තීරණාත්මක ගැටළුව විසඳීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනය යෝජනා කළ ක්‍රියාමාර්ග මොනවාද සහ ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීමට එය දායක වන්නේ කෙසේද?)

……………………………………………………………………………………………………

2.9. අපේක්ෂිත ප්‍රතිඵල (මේවා ආර්ථික, දේශපාලනික, සමාජීය, පාරිසරික, සංස්කෘතික, පෝෂණ ආදී විය හැක).

1.

2.

2.10. ප්‍රතිලාභීන් (ප්‍රතිලාභීන්ගේ ස්වභාවය - පිරිමි සහ ගැහැණු සංඛ්‍යාවට අමතරව, යුද්ධයෙන් බලපෑමට ලක් වූ අඩු ආදායම්ලාභී හෝ ආදිවාසී කණ්ඩායම්වලට අයත් වීම වැනි වෙනත් ලක්ෂණ ද සඳහන් කරන්න).

……………………………………………………………………………………………………

2.11. ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගී වන්නේ ප්‍රතිලාභීන්ගෙන් කවුරුන්ද?

2.12. කාන්තාවන්ට ප්‍රතිලාභ ලැබෙන්නේ කෙසේද?
………………………………………………………………………………………………

2.13. මෙහෙයුම් සහ නඩත්තුව සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇතුළුව මෙහෙයුම් සහ නඩත්තුව (O&M) සඳහා වගකිව යුත්තේ කවුද?
………………………………………………………………………………………………

2.14. විභව අවදානම් සහ අවදානම් අවම කිරීම සඳහා යෝජනා කරන උපාය මාර්ග

2.15. ව්‍යාපෘතිය සෘණ ලැයිස්තුවට හෝ නියමිත ලැයිස්තුවට අයත් වේද?

(a) ඔව් නම්, කරුණාකර IEE හෝ EIA අවශ්‍යද යන්න පැහැදිලි කරන්න.

………………………………………………………………………………………………

(b) නැත නම්, IEER/EIS ආකෘතිය අවශ්‍ය වේ.

2.16. උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විය හැකි යෝජිත ගොවි සංවිධානවල හෝ නිෂ්පාදක සංවිධානවල නම්/නම් (අදාළ නම්, විස්තර අමුණා තිබිය යුතුය).
………………………………………………………………………………………………

3. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

3.1. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ආකාරය සහ කුමන කොටස්කරුවන් සමඟද? (ප්‍රමාණවත් විස්තර සහිතව විස්තර කරන්න).
………………………………………………………………………………………………

**3.2. ටෙන්ඩර් ක්‍රියාවලිය (අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට සැලසුම් කර ඇති ආකාරය පැහැදිලි කරන්න).**

**3.3. ක්‍රියාකාරී සැලැස්ම (කාල රාමුව සහ ක්‍රියාත්මක කරන වගකිවයුතු ආයතන/පුද්ගලයින් සමඟ ක්‍රියාකාරකම් සැලැස්ම විස්තර කරන්න. මෙය Gantt ප්‍රස්ථාරයක් භාවිතයෙන් විස්තර කළ යුතුය).**

**4. උප ව්‍යාපෘතිය අධීක්ෂණ යාන්ත්‍රණය: (මෙය ඉතා වැදගත් වේ. එබැවින් ප්‍රමාණවත් විස්තර සපයමින් අධීක්ෂණ කටයුතු සිදු වන ආකාරය විස්තර කරන්න).**

………………………………………………………………………………………………

**5.** **උප ව්‍යාපෘති ඇගයුම් යාන්ත්‍රණය: (කරුණාකර ක්‍රියාත්මක කරන ආයතනය ව්‍යාපෘතිය ඇගයීමට සැලසුම් කරන්නේ කෙසේද සහ කුමන කාල පරාසයන් වලදීද යන්න දක්වන්න)**

……………………………………………………………………………………………………

**6.** **වාර්තාකරණ විධිවිධාන (මූල්‍ය සහ ප්‍රගති වාර්තාකරණය සහ අපේක්ෂිත කාලසීමාව යන දෙකම සිදුකිරීමේ වගකීම භාරගන්නේ කවුරුන්ද යන්න විස්තර කරන්න)**

7. **ඇස්තමේන්තුගත පිරිවැය:**

| අංකය | ප්‍රධාන කාර්යය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් වලින් | ප්‍රජා දායකත්වය රුපියල් | වෙනත් මූලාශ්‍ර (නිශ්චිත) රුපියල් | දායක නියෝජිතායතනයෙන් අපේක්ෂිත මුදල රුපියල් |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |

**8.** **ඉදිරිපත් කිරීම**

**8.1.** **එල්ලංගා කළමනාකරණ කමිටුව (CMC) වෙනුවෙන් උප ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමට බලයලත් පුද්ගලයා**

**8.2.** **තනතුර, සම්බන්ධතා තොරතුරු, මුද්‍රාව, ඉදිරිපත් කළ දිනය**

**09.** **ඇමුණුම් :**

**(උප ව්‍යාපෘති යෝජනාව සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු සැපයීමට සහ එමඟින් අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කරුණාකර අදාළ සියලුම අමතර විස්තර අමුණන්න.)**